ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 2002 අංක 17 දරන මැනුම් පනත

---

[සහතිකය සටහන් කළේ 2002 ඔක්තෝබර් මස 04 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2002 ඔක්තෝබර් මස 04 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 32.25 යි.    තැපැල් ගාස්තුව : රු. 9.00 යි.

# 2002 අංක 17 දරන මැනුම් පනත

[සහතිකය සටහන් කළේ 2002 ඔක්තෝබර් මස 04 වන දින]

එල්. ඩී.–ඕ. 36/98.

**සර්වේයර් ජනරාල්වරයාට අදාළ බලතල සහ කාර්ය සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසද ; ඉඩම් මැනීම් විධිමත් කිරීම සඳහාද ; මිනින්දෝරුවරුන්ගේ වෘත්තීමය ක්‍රියා පැවැත්ම විධිමත් කිරීම අරභයා ඉඩම් මැනුම් සභාවක් පිහිටුවීම සඳහා ද ; ඉඩම් මැනුම් ආඥාපනත සහ මිනින්දෝරු ආඥාපනත ඉවත් කිරීම සඳහා ද ; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

1. මේ පනත 2002 අංක 17 දරන මැනුම් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

## I වන කොටස

## සර්වේයර් ජනරාල්වරයාගේ බලතල සහ කර්තව්‍යයන්

2. සර්වේයර් ජනරාල්වරයාගේ බලතල සහ කර්තව්‍යවලට පහත දැක්වෙන දෑ ඇතුළත් විය යුතු ය :– සර්වේයර් ජනරාල්වරයාගේ බලතල සහ කර්තව්‍ය.

(අ) ශ්‍රී ලංකාවේ සියලුම ඉඩම් මැනුම් කටයුතු විධිමත් කිරීම ;

(ආ) ජාතික භූමිතික පාලන ජාලය පිහිටුවීම සහ පරිපාලනය කිරීම ;

(ඇ) කැඩැස්තර, භූමිතික සහ භූලක්ෂණ මැනුම්වල නිරවද්‍යතාවය සඳහා ප්‍රමිති නිශ්චිතව සඳහන් කිරීම ;

(ඈ) සිතියම් සකස් කිරීම සඳහා ප්‍රමිති නියම කිරීම ;

(ඉ) 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ මැනුම් කටයුතු කිරීමට බලාපොරොත්තුවන ලියාපදිංචි මිනින්දෝරුවරුන් සඳහා පුහුණු ක්‍රමයක් පිහිටුවීම සහ පරිපාලනය කිරීම සහ පුහුණු සහතික නිකුත් කරනු ලැබූ මිනින්දෝරුවරුන්ගේ ලේඛනයක් පවත්වාගෙන යාම ;

2—H 015586—4,500 (2002/07)

# 2002 අංක 17 දරන මැනුම් පනත

[සහතිකය සටහන් කළේ 2002 සැප්තැම්බර් මස 04 වන දින]

එල්. ඩී.–ඕ. 36/98.

**සර්වේයර් ජනරාල්වරයාට අදාළ බලතල සහ කාර්ය සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසද ; ඉඩම් මැනීම විධිමත් කිරීම සඳහාද ; මිනින්දෝරුවරුන්ගේ වෘත්තිමය ක්‍රියා පැවැත්ම විධිමත් කිරීම අරභයා ඉඩම් මැනුම් සභාවක් පිහිටුවීම සඳහා ද ; ඉඩම් මැනුම් ආඥාපනත සහ මිනින්දෝරු ආඥාපනත ඉවත් කිරීම සඳහා ද ; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත 2002 අංක 17 දරන මැනුම් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

## I වන කොටස

## සර්වේයර් ජනරාල්වරයාගේ බලතල සහ කර්තව්‍යයන්

2. සර්වේයර් ජනරාල්වරයාගේ බලතල සහ කර්තව්‍යවලට පහත දැක්වෙන දෑ ඇතුළත් විය යුතු ය :- සර්වේයර් ජනරාල්වරයාගේ බලතල සහ කර්තව්‍ය.

(අ) ශ්‍රී ලංකාවේ සියලුම ඉඩම් මැනුම් කටයුතු විධිමත් කිරීම ;

(ආ) ජාතික භූමිතික පාලන ජාලය පිහිටුවීම සහ පරිපාලනය කිරීම ;

(ඇ) කැඩැස්තර, භූමිතික සහ භූලක්ෂණ මැනුම්වල නිරවද්‍යතාවය සඳහා ප්‍රමිති නිශ්චිතව සඳහන් කිරීම ;

(ඈ) සිතියම් සකස් කිරීම සඳහා ප්‍රමිති නියම කිරීම ;

(ඉ) 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ මැනුම් කටයුතු කිරීමට බලාපොරොත්තුවන ලියාපදිංචි මිනින්දෝරුවරුන් සඳහා ප්‍රතීතන ක්‍රමයක් පිහිටුවීම සහ පරිපාලනය කිරීම සහ ප්‍රතීතන සහතික නිකුත් කරනු ලැබූ මිනින්දෝරුවරුන්ගේ ලේඛනයක් පවත්වාගෙන යාම ;

(ඨ) මැනුම්පට සහ ඉලෙක්ට්‍රොනික දුර මැනීමේ උපකරණ අංක ශෝධනය කිරීම සඳහා පාදක රේඛා පිහිටුවීම හා සියලුම මිනින්දෝරුවන්ට ඒවා ලබාදීම ;

(ඩ) කැඩැස්තර පිඹුරු හා සිතියම් පිළියෙල කිරීමට පහසුවන පරිදි සහ ඉඩම් තොරතුරු ඒකරාශී කිරීම සඳහා ආධාර කරගත හැකි පරිපූර්ණ පාදකයක් වන පරිදි, කැඩැස්තර මැනුම් වාර්තා ලබා ගැනීම, අනුමත කිරීම සහ පවත්වාගෙන යාම ;

(ඪ) භූලක්ෂණ, තේමා සහ විශේෂ කාර්යයන් සඳහා වූ සිතියම් නිෂ්පාදනය කිරීම සහ අදාළ ලේඛන පවත්වාගෙන යාම ;

(ණ) මැනීම සහ සිතියම්ගත කිරීම, භූගෝලීය පදනමක් මත වූ තොරතුරු සහ ඉඩම් තොරතුරු පද්ධතිය සඳහා වූ අවශ්‍යතා සමඟ අදාළ ඉඩම් තොරතුරු ඒකාබද්ධ කිරීම, ප්‍රවර්ධනය කිරීමේ කාර්යයන් සඳහා වූ සියලු දත්ත ලබාගැනීම, රැස්කිරීම සහ යම් අයුරකින් හුවමාරු කිරීම සම්බන්ධයෙන් වගකිවයුතු ප්‍රධාන බලධරයා වීම ;

(ත) ඉඩම් මැනීම, ඉඩම් තොරතුරු සැපයීම සහ ඊට අදාළ සේවා සැපයීම ;

(ථ) භූ ලක්ෂණ, කැඩැස්තර හා ව්‍යුත්පන්න සිතියම්, දුරස්ථ ග්‍රහණ දත්ත, ගුවන් ඡායාරූප සහ වෙනත් මැනුම් සහ සිතියම්කරණය පිළිබඳ ලේඛන ලබාගැනීම, ගබඩා කිරීම, ප්‍රතිනිෂ්පාදනය කිරීම සහ බෙදා හැරීම ;

(ද) උචිත අවස්ථාවල දී, දෙපාර්තමේන්තුව විසින් ලේඛනගත කළ මැනුම් සහ ඉඩම් තොරතුරු භාවිත කිරීම හෝ ප්‍රතිනිෂ්පාදනය සඳහා බලය දීම සහ ඒ තොරතුරු භාවිත කිරීම හෝ ප්‍රතිනිෂ්පාදනය කිරීම සඳහා ගාස්තුවක් අයකිරීම ;

(ධ) ඉඩම් මැනීම, සිතියම්කරණය සහ ඉඩම් තොරතුරු සඳහා වූ තාක්ෂණය හුවමාරු කරගැනීම සඳහා අවශ්‍ය අවස්ථාවන්හි දී විදේශීය නියෝජිත ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම ;

(ඡ) ඉඩම් මැනීම, සිතියම්කරණය සහ ඉඩම් තොරතුරු ක්‍රියාකාරකම් හා අදාළ කරුණු පිළිබඳව ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවකට, යම් රාජ්‍ය සංස්ථාවකට හෝ වෙනත් ආයතනයකට උපදෙස් දීම හා එසේ දෙනු ලැබූ උපදෙස් වෙනුවෙන් ඒ සංස්ථාවෙන් හෝ ඒ ආයතනයෙන් ගාස්තුවක් අයකිරීම ;

(ජ) ඉඩම් මැනීමට අදාළ කාරුණු සම්බන්ධයෙන් අවශ්‍යවිය හැකි පර්යේෂණ පැවැත්වීම ;

(ඣ) යම් ලියාපදිංචි මිනින්දෝරුවරයකුගේ ප්‍රයෝජනය සඳහා මිනින්දෝරුවරයකුගේ ක්ෂේත්‍ර සටහන් භාවිත කරමින් පිඹුරු සකස් කිරීමට සහ පිඹුරුවල වර්ග ප්‍රමාණය ගණනය කිරීමට ප්‍රවීණත්වයක් ඇති යම් තැනැත්තකුට, එම ප්‍රවීණත්වය පිළිබඳව විභාග පවත්වා තමා සෑහීමකට පත්වීමෙන් පසුව, සැලසුම්කරුවකු ලෙස ක්‍රියා කිරීමට බලය දෙන සහතික නිකුත් කිරීම ;

(ට) දෙපාර්තමේන්තුව තුළ ඉඩම් මැනීම පිළිබඳ ක්‍රියාකාරකම්වල යෙදී සිටින තැනැත්තන් අතර උසස් වෘත්තීයමය ප්‍රමිතීන් පවත්වාගෙන යාමට වගබලා ගැනීම.

සර්වේයර් ජනරාල්වරයාගේ බලතල හා කර්තව්‍ය පැවරීම.

**3.** (1) මේ පනත යටතේ සර්වේයර් ජනරාල්වරයා වෙත ප්‍රදානය කරනු ලැබ ඇති හෝ පවරනු ලැබ ඇති යම් බලයක් හෝ කර්තව්‍යයක් සර්වේයර් ජනරාල්වරයාගේ අත්සන යටතේ වූ ලියවිල්ලක් මඟින් ඔහු විසින් නම් කරනු ලැබිය හැකි දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකුට කලින් කල පවරා දෙනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් බලයක් හෝ කර්තව්‍යයක් පවරනු ලැබ ඇති සෑම නිලධරයෙක්ම සර්වේයර් ජනරාල්වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානයන්ට යටත්ව, ඒ බලය හෝ කර්තව්‍යය ක්‍රියාත්මක කිරීම හෝ ඉටුකිරීම කළ යුතු ය.

මැනුම්කරණයට හෝ සිතියම්කරණයට අදාළ යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් සර්වේයර් ජනරාල්වරයාගේ තීරණය අවසන් තීරණය විය යුතු බව.

**4.** ඉඩම් මැනීමට හෝ සිතියම්කරණයට අදාළ යම් ප්‍රශ්නයක දී සර්වේයර් ජනරාල්වරයාගේ තීරණය අවසාන හා තීරණාත්මක විය යුතු ය.

ජාතික භූමිතික පාලන පද්ධතියක් පිහිටුවීම සහ පවත්වාගෙන යාම.

**5.** (1) ජාතික භූමිතික පාලන පද්ධතියක් පිහිටුවීම, පවත්වාගෙන යාම සහ අවශ්‍යවන අවස්ථාවක දී එහි තත්ත්වය උසස් කිරීම පිළිබඳව සර්වේයර් ජනරාල්වරයා වගකිව යුතු ය.

(2) ජාතික භූමිතික පාලන පද්ධතියට සම්බන්ධ කළ යුතු ඉඩම් මැනුම් වර්ග සහ ඒ මැනුම් සම්බන්ධ කළ යුතු ආකාරය නියම කරනු ලැබිය හැකි පරිදි විය යුතු ය.

(3) ජාතික භූමිතික පාලන පද්ධතිය පිහිටුවීම, පවත්වාගෙන යාම සහ වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය සියලු ඉඩම් මැනුම් සර්වේයර් ජනරාල්වරයාගේ විධානය හා අධීක්ෂණය යටතේ පවත්වාගෙන යා යුතු ය.

(4) යම් ලියාපදිංචි මිනින්දෝරුවරයකු විසින් කරනු ලැබූ මැනුමක් ජාතික භූමිතික පාලන පද්ධතිය පවත්වාගෙන යාමේ හා වැඩිදියුණු කිරීමේ කාර්යය සඳහා විශේෂ වැදගත්කමකින් යුතු යයි සර්වේයර් ජනරාල්වරයාගේ මතය වන අවස්ථාවක දී ඔහු විසින් එම මැනුම් රැස්කිරීම හා සංචිත කිරීම කළ යුතු ය.

(5) (4) වන උපවගන්තියේ විධිවිධාන බලාත්මක කිරීමේ කාර්ය සඳහා යම් ලියාපදිංචි මිනින්දෝරුවරයකුගෙන් ඔහු සන්තකයේ පවතින සිතියම් හෝ පිඹුරු හෝ තොරතුරු සර්වේයර් ජනරාල්වරයා විසින් ඔහුට ලබාදෙන ලෙස ඉල්ලා සිටිය හැකි අතර, ඒ ඉල්ලීම පරිදි ක්‍රියාකිරීම ඒ මිනින්දෝරුවරයාගේ කාර්යය විය යුතු ය.

ගුවන් ඡායාරූපකරණය

**6.** ඉඩම් මැනීමට හා සිතියම්කරණය සඳහා වන සියලු ගුවන් ඡායාරූප ගතකිරීම් සර්වේයර් ජනරාල්වරයාගේ විධානය හා අධීක්ෂණය යටතේ කරගෙන යනු ලැබිය යුතු ය.

**7.** (1) ශ්‍රී ලංකාවේ සියලුම ජාතික භූලක්ෂණ සිතියම්කරණ සර්වේයර් ජනරාල්වරයාගේ විධානය හා අධීක්ෂණය යටතේ කරගෙන යා යුතු ය. සිතියම්කරණය.

(2) සර්වේයර් ජනරාල්වරයා විසින් උචිත යයි සලකනු ලබන අවස්ථාවල දී-

(අ) සාමාන්‍ය හා විශේෂ කාර්යය සඳහා වන සියලුම සිතියම් සකස් කිරීම හා නවීකරණය කිරීම සිදුකළ හැකි ය ;

(ආ) සංඛ්‍යාංක ක්‍රමයට හෝ මයික්‍රෝ ඡායාපටල මත හෝ වෙනත් කල්තබා ගතහැකි තත්ත්වයේ මාධ්‍යයක් මත හෝ පිඹුරු සහ සිතියම් ගබඩාකර තැබිය හැකි ය.

**8.** සර්වේයර් ජනරාල්වරයා විසින් මුළු ශ්‍රී ලංකාවම ක්‍රමක්‍රමයෙන් ආවරණය වන පරිදි සංඛ්‍යාංක හෝ වෙනත් ආකාරයෙන් භූගෝලීය දත්ත පාදකයක් සහ කැඩැස්තර දත්ත පාදකයක් පවත්වාගෙන යා යුතු ය. දත්ත පාදක.

**9.** ඕනෑම ලිඛිත නීතියක විධිවිධාන අනුව සිදුකරනු ලබන සියලුම ඉඩම් මැනුම් මේ පනත යටතේ පනවනු ලබන නියෝගවලට අනුකූල විය යුතු ය. ඉඩම් මැනුම්කරණය නියෝගවලට අනුකූලවීම.

**10.** (1) හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ කාර්යය ද වෙනත් යම් ලිඛිත නීතියක කාර්යයන් ද සඳහා මුළු ශ්‍රී ලංකාවම ක්‍රමක්‍රමයෙන් ආවරණය වන පරිදි සියලුම කැඩැස්තර සිතියම් සකස් කිරීම සහ පවත්වාගෙන යාම සර්වේයර් ජනරාල්වරයාගේ වගකීම විය යුතු ය. කැඩැස්තර පිඹුරු සහ සිතියම් පිළියෙල කිරීම.

(2) හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ කාර්යය සඳහා 11 වන වගන්තියේ ප්‍රකාර, සර්වේයර් ජනරාල්වරයාගෙන් ප්‍රතීතන සහතිකයක් ලබාගත්-

(අ) දෙපාර්තමේන්තුවේ සේවයෙහි නියුක්ත ලියාපදිංචි මිනින්දෝරුවරයකු විසින් ; හෝ

(ආ) වාර්ෂික වෘත්තීයමය බලපත්‍රය දරන ලියාපදිංචි මිනින්දෝරුවරයකු විසින්,

කැඩැස්තර මැනීම කළ යුතු ය. මේ වගන්තියේ කාර්යය සඳහා කරන ලද කැඩැස්තර මැනීම මත පදනම් වූ, තමා විසින් පිළියෙල කරන ලද සියලු සිතියම් හා පිඹුරු ලියාපදිංචි මිනින්දෝරුවරයා විසින් සහතික කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ සකස් කරනු ලැබූ සියලු කැඩැස්තර සිතියම් සහ පිඹුරු සර්වේයර් ජනරාල්වරයා විසින් හෝ සර්වේයර් ජනරාල්වරයා විසින් ඒ වෙනුවෙන් නිසි බලය දෙන ලද ලියාපදිංචි මිනින්දෝරුවරයකු විසින් පරීක්ෂා කරනු ලැබිය යුතු අතර, එකී සිතියම් හා පිඹුරු නිසි පිළිවෙළින් ඇතැයි ඔහු විසින් සෑහීමට පත්වන අවස්ථාවක දී අවස්ථාවෝචිත පරිදි සර්වේයර් ජනරාල්වරයා හෝ එම ලියාපදිංචි මිනින්දෝරුවරයා විසින් අනුමත කරනු ලැබිය යුතු ය.

(4) හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ කැඩැස්තර සිතියම් සකස් කිරීම සඳහා මනිනු ලැබූ මායිම් සම්බන්ධයෙන් රාජ්‍ය මායිම් ගල් ආඥා පනතේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ කරගත යුතු ය.

සර්වේයර් ජනරාල්වරයා විසින් ප්‍රතිතත සහතික නිකුත් කිරීම.

11. (1) (අ) මිනින්දෝරුවරයකු ඉඩම් මැනුම් සභාවෙන් ලියාපදිංචිය ලබාගෙන ඇති විට ; සහ

(ආ) හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ කාර්ය සඳහා කැඩැස්තර මැනුම්කරණය කරගෙන යාම පිළිබඳ ඒ මිනින්දෝරුවරයාගේ නිපුණතාව සම්බන්ධයෙන් අගැයීම් ක්‍රියාවලියක් මගින්,

සර්වේයර් ජනරාල්වරයා සෑහීමකට පත්වීමෙන් පසුව එවැනි මිනින්දෝරුවරයකුට කැඩැස්තර මැනුම් කරගෙන යාමට බලය පවරා දෙමින් ඔහු වෙත ප්‍රතීතන සහතිකයක් නිකුත් කළ යුතු ය.

(2) ප්‍රතීතන සහතිකයක් නිකුත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ යුතු ක්‍රමය හා ආකාරය ද, එම සහතිකය නිකුත් කිරීම සඳහා සර්වේයර් ජනරාල්වරයා විසින් අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය ද නියමිත පරිදි විය යුතු ය.

ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරයකු විසින් පිඹුරු සහ සිතියම් තැන්පත් කිරීම.

12. (1) ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරයකු විසින් පසක්කර සහතික කරන ලද නියමිත වර්ගවල මුල් පිඹුරුවල හෝ සිතියම්වල පිටපත් එම පිඹුරු හෝ සිතියම් සහතික කිරීමෙන් දින තිහක් (30) ඇතුළත සර්වේයර් ජනරාල්වරයා වෙත හෝ ඒ කාර්ය සඳහා ඔහු විසින් නිසි පරිදි බලය ලබාදෙන ලද නිලධරයකු වෙත දත්ත පාදකයක් පිහිටුවීම සඳහා තැන්පත් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ තැන්පත් කළ යුතු යයි නියම කරනු ලැබූ නියමිත වර්ගවල පිඹුරු හෝ සිතියම් ද ඒ පිඹුරු හෝ සිතියම් තැන්පත් කළ යුතු ආකාරය ද නියමිත පරිදි විය යුතු ය.

(3) ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරයකු විසින් (1) වන උපවගන්තිය යටතේ පිඹුරක් හෝ සිතියමක් සර්වේයර් ජනරාල්වරයා වෙත තැන්පත්කර ඇති අවස්ථාවක දී එම පිඹුර හෝ සිතියම, හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ සැකැස්කර පිඹුරක් හෝ සිතියමක් සකස් කිරීම සඳහා අවශ්‍ය වන්නේ නම් ඒ මිනින්දෝරුවරයාට 1979 අංක 52 දරන බුද්ධිමය දේපළ නීති සංග්‍රහය පනතේ 10 වන වගන්තිය යටතේ ඔහුගේ කෘතිවල ආරක්ෂාව සඳහා හිමිකම් නොමැති විය යුතු ය.

සිවිල් නඩු කටයුතුවල දී සාක්ෂි ලෙස පිඹුරු හෝ සිතියම් පාවිච්චි කිරීම.

**13.** යම් පිඹුරක් හෝ සිතියමක්-

(අ) සර්වේයර් ජනරාල්වරයා විසින් හෝ ඔහු වෙනුවෙන් ඔහු විසින් යථාපරිදි බලය පවරනු ලැබූ ලියාපදිංචි මිනින්දෝරුවරයකු විසින් සකස් කරනු ලැබ සර්වේයර් ජනරාල්වරයා විසින් හෝ තත්කාර්යය සඳහා ඔහු විසින් යථා පරිදි බලය පවරනු ලැබූ ලියාපදිංචි මිනින්දෝරුවරයකු විසින් සහතික කරනු ලැබ ; හෝ

(ආ) ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරයකු විසින් සහතික කරනු ලැබ,

නොමැතිවිට ඒ පිඹුර හෝ සිතියම හෝ පිඹුරේ හෝ සිතියමේ අනුරේඛණයක් හෝ පිටපතක් ශ්‍රී ලංකාවේ කිසිම උසාවියකට සාක්ෂියක් වශයෙන් ඉදිරිපත් කරනු නොලැබිය යුතු ය.

සර්වේයර් ජනරාල්වරයා හෝ බලය දෙන ලද ලියාපදිංචි මිනින්දෝරුවරයකු වෙතත් අය විසින් ඔප්පු ඉදිරිපත් කරන ලෙස බලකර ඉල්ලා සිටිය හැකි බව.

**14.** සර්වේයර් ජනරාල්වරයා විසින් හෝ ඔහු විසින් තත්කාර්ය සඳහා ලියවිල්ලකින් බලය දෙන ලද යම් ලියාපදිංචි මිනින්දෝරුවරයකු විසින් ඉඩම් මැනීමේ කාර්ය සඳහා අවශ්‍ය බව ඔහුට පෙනෙන කවර හෝ අවස්ථාවක–

(අ) යම් ඉඩමක හෝ පරිශ්‍රයක අයිතිකරු යයි හිමිකම්පාන තැනැත්තාගෙන් හෝ ඔහුගේ නියෝජිතයාගෙන් ඒ ඉඩමට හෝ පරිශ්‍රයට ඔහු හිමිකම් පාන්නේ කවර ඔප්පුවක්, ලේඛනයක් හෝ වෙනත් සාධන පත්‍රයක් මත ද, ඒ සෑම ඔප්පුවක්, ලේඛනයක් හෝ සාධන පත්‍රයක් ඉදිරිපත් කරන ලෙස ද ;

(ආ) ඒ ඉඩමේ හෝ පරිශ්‍රයේ පදිංචිකරුගෙන් ඔහු එහි පදිංචිය ආරම්භ කළේ කවර බලයක් මත ද, ඒ බලය සහ ඒ ඉඩමේ හෝ පරිශ්‍රයේ අයිතිකරුගේ වාසස්ථාන පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන ලෙස ද,

ලියවිල්ලකින් ඉල්ලා සිටීම නීත්‍යානුකූල වන අතර අවස්ථාවෝචිත පරිදි, ඒ අයිතිකරු විසින් හෝ පදිංචිකරු විසින් එසේ ඉල්ලා සිටියේත් දින දහයක් ඇතුළත—

(i) එකී ඉඩමට හෝ පරිශ්‍රයට ඔහුගේ හිමිකම්පෑම සාධක කරගත් ඒ ඔප්පු, ලේඛන හෝ වෙනත් සාධන පත්‍ර හේතුවක් නැතිව ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබූ හෝ පැහැර හරිනු ලැබූ අවස්ථාවක ;

(ii) ඒ ඔප්පු, ලේඛන හෝ වෙනත් සාධන පත්‍ර ඔහුගේ සන්තකයේ නොතිබීම නිසා ඒ ඔප්පු, ලේඛන හෝ සාධන පත්‍ර ඉදිරිපත් කිරීමට නොහැකි වූ සහ ඒ ඔප්පු, ලේඛන හෝ වෙනත් සාධන පත්‍ර ඇත්තේ කවර තැනැත්තකුගේ සන්තකයෙහි ද හේතුවක් නැතිව ඒ තැනැත්තා සම්බන්ධයෙන් දැනුම්දීම හෝ තොරතුරු සැපයීම ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක,

ඒ අයිතිකරු හෝ පදිංචිකරු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දසදහසකට නොවැඩි දඩයකට ඔහු යටත්විය යුතු ය.

ඔප්පු, ලේඛන හෝ වෙනත් සාධන පත්‍ර ඉදිරිපත් කරන ලෙස කරන ඉල්ලීමට ඒවා පරීක්ෂා කිරීමේ බලය ද ඇතුළත් බව.

**15.** 14 වන වගන්තිය යටතේ ඉල්ලා සිටිනු ලැබූ ඔප්පුවක්, ලේඛනයක් හෝ වෙනත් සාධන පත්‍රයක් ඒ ඔප්පුව, ලේඛනය හෝ සාධන පත්‍රය අදාළ වන පරිශ්‍රයේ දී හෝ ඒ ඉල්ලීම කරන තැනැත්තා විසින් නියම කරනු ලබන වෙනත් යම් ස්ථානයක දී හෝ ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර 14 වන වගන්තිය යටතේ ඒවා ඉදිරිපත් කරන ලෙස කරනු ලබන ඉල්ලීමේ බලයට අවශ්‍ය වන පරිදි ඉඩම් මැනීමේ කාර්ය සඳහා ඒ ඔප්පු, ලේඛන හෝ වෙනත් සාධන පත්‍ර පරීක්ෂා කිරීමේ බලය ද ඇතුළත් වන ලෙස සලකනු ලැබිය යුතු ය. තවද මේ පනත යටතේ 14 වන වගන්තියේ සඳහන් යම් තැනැත්තකුට එවැනි යම් ඔප්පුවක්, ලේඛනයක් හෝ වෙනත් සාධන පත්‍රයක් හේතුවක් නැතිව පරීක්ෂා කිරීමට අවසරදීම ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින සෑම තැනැත්තෙකුම වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දසදහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය.

16. (1) සර්වේයර් ජනරාල්වරයා හෝ ඔහු විසින් තන්කාර්ය සඳහා බලය පවරන ලද ලියාපදිංචි මිනින්දෝරුවරයකු යම් ඉඩමක හෝ පරිශ්‍රයක පදිංචිකරුට සාධාරණ දැනුම්දීමකින් පසුව එම ඉඩමට හෝ පරිශ්‍රයට ඇතුළු වී ඒ පිළිබඳ ඉඩම් මැනීමක් කරගෙන යාම සඳහා අවස්ථාවෝචිත පරිදි සර්වේයර් ජනරාල්වරයාට හෝ බලය පවරනු ලැබූ ඒ මිනින්දෝරුවරයාට අවශ්‍ය විය හැකි යම් පරීක්ෂාවක් කිරීම, මැනුමක් සිදුකිරීම හා මැනුම් සලකුණින් පිහිටුවීම කළ හැකි ය.

සර්වේයර් ජනරාල්වරයාට ඉඩමකට ඇතුළු වී සිය මැනීම කළ හැකි බව.

(2) ඇතුළුවීමට අවම වශයෙන් දින තුනකට පෙර මැනුම්වලට අදාළ ඉඩම් හෝ පරිශ්‍රය ඇතුළත හෝ ඊට ඉතා ආසන්නව ප්‍රකට හෝ පෙනෙන ස්ථානයක සවිකරන ලද ලිඛිත දැන්වීමක් (1) වන උපවගන්තියේ කාර්ය සඳහා සාධාරණ දැනුම් දීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) සර්වේයර් ජනරාල්වරයා විසින් හෝ තන්කාර්ය සඳහා ඔහු විසින් ලිඛිතව බලය පවරන ලද ලියාපදිංචි මිනින්දෝරුවරයකු විසින් මේ පනතේ හෝ වෙනත් ලිඛිත නීතියක විධිවිධාන යටතේ ඉඩමට ඇතුළු වී මැනුමක් පවත්වාගෙන යාම හා එම ඉඩමේ හෝ පරිශ්‍රයේ අයිතියට හෝ යම් නෛතික සම්බන්ධතාවකට බලපාන යම් ඔප්පුවක් හෝ ලේඛනයක් හෝ වෙනත් සාධක පත්‍රයක් හෝ පිඹුරක් ඉදිරිපත් කරන ලෙස දැන්වීමක් මගින් හෝ ලියවිල්ලකින් එම ඉඩමේ හෝ පරිශ්‍රයේ අයිතිකරුගෙන් ඉල්ලා සිටීම නීත්‍යානුකූල වන්නේ ය. එම අයිතිකරු හෝ පදිංචිකරු විසින් එම ඉල්ලීමේ දින සිට දින දහයක් ඇතුළත අවස්ථාවෝචිත පරිදි සර්වේයර් ජනරාල්වරයා වෙත හෝ බලය පවරනු ලැබූ වෙනත් මිනින්දෝරුවරයකු වෙත ඒ ඔප්පුව, ලේඛනය හෝ සාධක පත්‍රය හෝ පිඹුර ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) ඒ ඔප්පුව, ලේඛනය, වෙනත් සාධක පත්‍රය හෝ පිඹුර ඉදිරිපත් කිරීමේ දී ඒ සර්වේයර් ජනරාල්වරයා විසින් ඒවා පරීක්ෂාකර මේ පනතේ කාර්ය සඳහා හෝ වෙනත් යම් ලිඛිත නීතියක කාර්ය සඳහා එම ඔප්පුව, ලේඛනය, වෙනත් සාධක පත්‍රය හෝ පිඹුරක සටහන් ලියාගැනීම එම ඔප්පුවේ, ලේඛනයේ, සාධක පත්‍රයේ හෝ පිඹුරේ උධෘත සහ පිටපත් ලබාගැනීම නීත්‍යානුකූල වන්නේ ය.

සර්වේයර් ජනරාල්වරයා සහ වෙනත් අය විසින් බලය අනිසි ලෙස යෙදීම සඳහා වන දඬුවම.

**17.** සර්වේයර් ජනරාල්වරයා හෝ සර්වේයර් ජනරාල්වරයා විසින් ඒ වෙනුවෙන් බලය පවරන ලද ලියාපදිංචි මිනින්දෝරුවරයකු විසින් මේ පනත මගින් ඔහු වෙත නියම කළ හෝ පැවරූ යම් බලයක් ක්‍රියාත්මක කිරීමේ අයිතිවාසිකම් කියා පෑම යටතේ ඔහුගේ බලය අනිසි ලෙස යෙදීම හෝ අනවශ්‍ය බලාත්කාරය භාවිත කිරීම හෝ හිතුවක්කාර ලෙස යම් තුවාල සිදු කිරීම හෝ අනවශ්‍ය පීඩාකාරී හිරිහැරයක් සිදු කළ නම්, ඒ සර්වේයර් ජනරාල්වරයා හෝ ඒ මිනින්දෝරුවරයා වරදකට වරදකරු විය යුතු අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දස දහසකට නොවැඩි දඩ මුදලක් ගෙවීමට යටත් විය යුතු ය.

ඉඩම් මැනුම්වලට බාධා කිරීම.

**18.** සර්වේයර් ජනරාල්වරයා හෝ තත්කාර්ය සඳහා ඔහු විසින් බලය පවරනු ලැබූ ලියාපදිංචි මිනින්දෝරුවරයකු හෝ ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරයකු හෝ ඒ සර්වේයර් ජනරාල්වරයාට, මිනින්දෝරුවරයාට සහාය වන යම් තැනැත්තකු යම් මැනුමකට අදාළව සිය කාර්ය ඉටුකිරීමේ දී හෝ යම් මායිම් හෝ මැනුම් රේඛාවක් නිශ්චය කිරීමේ දී හෝ ලකුණු කිරීමේ දී හෝ යම් මැනුම් සලකුණක් සවිකිරීමේ දී, තැබීමේ දී, නැවත පිහිටුවීමේ දී, අලුත්වැඩියා කිරීමේ දී හෝ පිහිටුවීමේ දී එම සර්වේයර් ජනරාල්වරයාට හෝ ඔහු විසින් බලය පවරන ලද තැනැත්තාට හෝ ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරයාට හෝ ඔවුනට සහාය වන තැනැත්තකුට ඕනෑමනාම බාධා කරන හෝ අවහිර කරන සෑම තැනැත්තෙකුම වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දසදහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය.

මැනුම් සලකුණු වෙනස් කිරීම.

**19.** (1) මැනුමක් පාලනය කිරීම සඳහා හෝ මායිම් නිර්ණය කිරීම සඳහා හෝ මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ එහි කාර්ය සඳහා වූ යම් මැනුමක කාර්ය සඳහා තබනු ලැබ ඇති හෝ පිහිටුවා ඇති යම් මැනුම් සලකුණක ස්ථානය හෝ එය සලකුණු කිරීම දැන දැනම හෝ සිතා මතා ඉවත් කරන හෝ විනාශ කරන හෝ වෙනස් කරන සෑම තැනැත්තෙකුම වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී ඔහු රුපියල් දසදහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ වරදකට වරදකරු වන සෑම තැනැත්තෙක් ම එම වරද සම්බන්ධයෙන් ඔහු ගෙවීමට යටත්වන දඩයට අමතරව, මිනින්දෝරු ගාස්තුව ද ඇතුළුව ඔහු වරදකරු වූ වරදේ විෂය කරුණු වූ යම් මැනුම් සලකුණක් අලුත්වැඩියා කිරීමට, නැවත පිහිටුවීමට හෝ එය තිබූ ස්ථානයේ සවිකිරීමට අදාළ යම් ගාස්තුවක් හෝ යම් මැනුම් සලකුණක් නැවත සලකුණු කිරීමේ ගාස්තුවක් ද ගෙවීමට ඔහු යටත් විය යුතු ය ; තව ද එම ගාස්තු සර්වේයර් ජනරාල්වරයා විසින් තක්සේරු කරනු ලැබ දඩයක් ලෙස අයකර ගනු ලැබිය යුතු ය.

**20.** මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ වූ යම් මැනුම්කරණ කාර්ය සඳහා යම් ස්ථානයක තබන ලද මැනුම් සලකුණක් හෝ මායිම් ගලක් බවට යම් තැනැත්තකු විශ්වාස කිරීමට පෙළැඹවීම සඳහා අදහස් කරමින්, නිසි පරිදි තබනු නොලැබූ මැනුම් සලකුණක් නොවන යම් කූඤ්ඤයක්, සලකුණක්, මායිම් ගලක් හෝ වෙනත් සලකුණක් යම් ඉඩමකට අදාළව යම් ස්ථානයක තබන සෑම තැනැත්තෙක් ම වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් විසිදහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය.

ව්‍යාජ මැනුම් සලකුණු.

**21.** මේ පනත හෝ යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනුකූලව සකස් කරනු ලැබ, සර්වේයර් ජනරාල්වරයා හෝ ඔහු වෙනුවෙන් වැඩ බලන නිලධරයකු විසින් අත්සන් තබන ලදැයි උද්දේශිත හා යම් සිවිල් නඩුවක දී සාක්ෂි වශයෙන් ඉදිරිපත් කරන ලද යම් කැඩැස්තර සිතියමක්, පිඹුරක් හෝ වෙනත් යම් පිඹුරක් හෝ සිතියමක් සාක්ෂි වශයෙන් භාරගත යුතු අතර එට පටහැනිව සාක්ෂි ඉදිරිපත් කරන තුරු, එම පිඹුර හෝ සිතියම ඇත්ත වශයෙන්ම සර්වේයර් ජනරාල්වරයා හෝ ඔහු වෙනුවෙන් වැඩ බලන යම් නිලධරයකු විසින් ඇත්ත වශයෙන් ම අත්සන් තබා ඇති බවට හෝ සර්වේයර් ජනරාල්වරයාගේ අධිකාරය යටතේ එය සකස් කරනු ලැබූ බව හෝ එම පිඹුරේ හෝ සිතියමේ නිරවද්‍යතාවය පිළිබඳව හෝ ඔප්පු කිරීම අනවශ්‍ය වේ.

සර්වේයර් ජනරාල්වරයා විසින් අත්සන් තබනු ලැබූ ඇතැම් පිඹුරු ඔප්පු කිරීම.

සර්වේයර් ජනරාල්වරයා විසින් අත්සන් තබන ලදැයි උද්දේශිත පිටපත් මුල් පිටපත වෙනුවට සාක්ෂි වශයෙන් ආදේශන කරනු ලැබිය හැකි ය.

**22.** සහතික පිටපතක් බවට උද්දේශිත වූ ද සර්වේයර් ජනරාල්වරයා හෝ ඔහු වෙනුවට වැඩ බලන යම් නිලධරයකු විසින් අත්සන් කරන ලදැයි උද්දේශිත වූ ද යම් කැඩැස්තර සිතියමක්, පිඹුරක් නැතහොත් යම් ලිඛිත නීතියකට අනුකූලව සකස් කරන ලද වෙනත් යම් පිඹුරක් හෝ සිතියමක් එහි මුල් පිටපතේ සහතික පිටපතක් වශයෙන් නම් සියලු නඩුවල දී හා සියලු කාර්ය සඳහා මුල් පිටපත වෙනුවට සාක්ෂි වශයෙන් ආදේශනය කරගනු ලැබිය යුතු අතර (මුල් පිටපත ලබාගත නොහැකි බව ඔප්පු කිරීමකින් තොරව) මුල් පිටපතේ මෙන්ම සම්පූර්ණයෙන් ම එහි පෙන්නුම් කරන සිද්ධිමය කරුණුවල සත්‍යතාවය පිළිබඳව බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් ලෙස පිළිගත යුතු ය. තවද ඊට පටහැනිව සාක්ෂි ඉදිරිපත් කරන තුරු, එකී පිටපත ඇත්ත වශයෙන් ම සර්වේයර් ජනරාල්වරයා විසින් හෝ ඒ නිලධරයකු විසින් හෝ අත්සන් තබා ඇති බව හෝ බලය දෙන ලද බව නැතහොත් එය සහතික පිටපතක් බව එහි සඳහන් කරුණු නිවැරදි බව හෝ ඔප්පු කිරීම අනවශ්‍ය වේ.

කැඩැස්තර සිතියම් හෝ පිඹුරු සකස් කිරීම හා ඉඩම් සලකුණු තැබීම.

**23.** (1) හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතට අනුව කැඩැස්තර සිතියමක් හෝ යම් පිඹුරක් සකස් කිරීම සඳහා මනින ලද මායිම් ස්ථිර භූමි ලකුණුවලින් නියම කරනු ලැබ නැති අවස්ථාවල දී, මායිම් ගල් යනුවෙන් සඳහන් කරනු ලබන සලකුණු මගින් නියම කරනු ලැබිය යුතු අතර එම ඉඩම් සලකුණු රාජ්‍ය මායිම් ගල් ආඥාපනතේ අර්ථානුකූලව මායිම් ගල් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) යම් ඉඩමක හෝ පරිශ්‍රයක සෑම පදිංචිකරුවකු, හිමිකම් පාන්නකු හෝ අයිතිකරුවකු විසින් ම එම ඉඩමේ හෝ පරිශ්‍රයේ මායිමේ තබා ඇති මායිම් ගල් හෝ එම ඉඩමේ හෝ පරිශ්‍රයේ ඇතුළත තබා ඇති යම් මිනුම් සලකුණක් වෙනස් නොකර පවත්වාගෙන යා යුතු ය :

එසේ වුව ද යම් රක්ෂිතයක් හෝ වෙන්කළ ඉඩමක් හෝ රජයේ ඉඩමක් හෝ රජයට අයත් පරිශ්‍රයක් සම්බන්ධයෙන් වනවිට එහි මායිමේ තබා ඇති මායිම් ගල් එකී රක්ෂිතයට, වෙන්කළ ඉඩමට, රජයේ ඉඩමට හෝ රජයට අයත් පරිශ්‍රයට යාබද ඉඩමට හිමිකම් පාන්නකු එම යාබද ඉඩමේ පදිංචිකරු, බදුකරු හෝ අයිතිකරු විසින් වෙනස් නොකර පවත්වාගෙන යා යුතු ය.

නියෝග.

**24.** (1) නියම කළ යුතු යයි මේ පනතින් නියමිත හෝ නියෝග සෑදීමට බලය දී ඇති යම් කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) විශේෂයෙන් (1) වන උපවගන්තිය මගින් පවරන ලද බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව පහත දැක්වෙන සියලුම හෝ යම් කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය :-

(අ) මුළු ශ්‍රී ලංකාවටම හෝ එහි කොටසක් ආවරණය වන පරිදි කැඩැස්තර සිතියම් සකස් කිරීමේ හා පවත්වාගෙන යාමේ ක්‍රමය හා ආකාරය ;

(ආ) ඉඩම් මැනුම් කළයුතු ආකාරය, මැනුමකට අදාළ සිතියම්, පිඹුරු, පොත් හා වෙනත් වාර්තා පිළියෙල කළ යුතු ක්‍රමය හා ආකාරය හා ඒ සිතියම්, පිඹුරු, පොත් හා වර්තාවල ඇතුළත් කළයුතු තොරතුරු ;

(ඇ) මැනුම්වල දී අත්කරගත යුතු නිරවද්‍යතා ප්‍රමාණයන් නියම කිරීම හා ඉවසිය හැකි දෝෂ සීමාවන් නියම කිරීම ;

(ඈ) මැනුම්වල නිරවද්‍යතා පරීක්ෂා කිරීම සඳහා ගතයුතු පියවර හා යොදාගනු ලැබිය හැකි යම් වැරදි නිවැරදි කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම.

(3) මේ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර එය එසේ පළකරනු ලැබූ දිනයේ සිට හෝ නියෝගවල නිශ්චිතව දක්වනු ලැබිය හැකි පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමෙන් මාස තුනක කාලයක් ඇතුළත අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එහි අනනුමතයේ දින සිට එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොමැතිව, පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

ඉවත් කිරීම හා ඉතිරිකිරීම.

**25.** (1) (අ) (458 වන අධිකාරය වූ) ඉඩම් මැනුම් ආඥා පනත ; හා

(ආ) (108 වන අධිකාරය වූ) මිනින්දෝරු ආඥා පනත,

මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) ඉඩම් මැනුම් ආඥාපනත ඉවත් කරනු ලැබුව ද-

(අ) එකී ආඥාපනත යටතේ සර්වේයර් ජනරාල්වරයා හෝ සර්වේයර් ජනරාල්වරයා විසින් ඒ වෙනුවෙන් බලය පවරන ලද වෙනත් යම් නිලධරයකු විසින් අත්සන් කළ සියලුම පිඹුරු හා සිතියම් මේ පනත යටතේ අත්සන් කරනු ලැබූ පිඹුරු හා සිතියම් වශයෙන් වලංගුව ක්‍රියාත්මක විය යුතු ය ;

(ආ) මිනින්දෝරු ආඥාපනත ඉවත් කරනු ලැබුව ද-

(i) ඒ ආඥාපනත යටතේ සාදන ලදුව මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මකව පැවති නියෝග මේ පනතේ විධිවිධාන සමග අනනුකූල නොවන තාක් දුරට මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් වෙනස් කර සංශෝධනය කරනු ලැබූ හෝ පරිච්ඡින්න කරනු ලබන තෙක් තවදුරටත් බලපැවැත්විය යුතු ය ;

(ii) ඒ ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව බලපත්‍රලත් මිනින්දෝරුවරයකු විසින් සකස් කරන ලද සියලු පිඹුරු හා සිතියම් මේ පනත යටතේ සකස් කරන ලද පිඹුරු හා සිතියම් වශයෙන් වලංගු ලෙස ක්‍රියාත්මක විය යුතු ය;

(iii) ඒ ආඥාපනත යටතේ පැලසුම්කරුවකු ලෙස ක්‍රියාකිරීමට යම් තැනැත්තකුට බලය පවරමින් සර්වේයර් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද සහතික මේ පනත යටතේ නිකුත් කරන ලද සහතික ලෙස සලකනු ලැබිය යුතු ය ;

iv) ඒ ආඥාපනත යටතේ සර්වේයර් ජනරාල්වරයා විසින් පවත්වන ලද සියලු විභාග මේ පනත ආරම්භවීමට පෙරාතුව අවම වශයෙන් එක් වතාවක්වත් එකී විභාගය සඳහා පෙනී සිටිනු ලැබ ඇති යම් අපේක්ෂකයකුට අවශ්‍ය සුදුසුකම් ලබාගැනීමට අවස්ථාවක් සැලසීමේ එකම කාර්ය සඳහා පමණක් මේ පනත ආරම්භවන දින සිට අවුරුදු පහක කාලයක් සඳහා සර්වේයර් ජනරාල්වරයා විසින් පවත්වාගෙන යා යුතු ය.

## II කොටස

### ඉඩම් මැනුම් සභාව

**26.** (1) (මේ පනතේ මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ඉඩම් මැනුම් සභාව යනුවෙන් හඳුන්වනු ලබන සභාවක් පිහිටුවනු ලැබිය යුතු ය. ඉඩම් මැනුම් සභාව පිහිටුවීම.

(2) සභාව, (1) වන උපවගන්තිය යටතේ ඊට පවරන ලද නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් සභාව විසින් ද, සභාවට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය.

**27.** සභාව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :– සභාවේ සාමාජිකයන්.

(අ) නිල බලයෙන් සාමාජිකයන් වන තැනැත්තන් එනම්–

(i) සභාපතිවරයා විය යුතු සර්වේයර් ජනරාල්වරයා ;

(ii) උප සභාපතිවරයා විය යුතු සර්වේයර් ජනරාල්වරයා විසින් නම් කරනු ලබන නියෝජ්‍ය සර්වේයර් ජනරාල් ධුරයට අඩු නොවන ධුරයක් දරන ලියාපදිංචි මිනින්දෝරුවරයකු ;

(iii) 1969 අංක 21 දරන මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතන පනත මගින් පිහිටුවන ලද මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයේ අධ්‍යක්ෂවරයා ; සහ

(ආ) පත්කළ සාමාජිකයන්, එනම්-

(i) 1982 අංක 22 දරන ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත මගින් සංස්ථාගත කරන ලද ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ ආයතනය විසින් නම් කරනු ලබන ඉඩම් මැනීම පිළිබඳ පූර්ණ අත්දැකීම් හා ප්‍රායෝගික සාමාර්ථයක් දරන ඉංජිනේරුවරුන් තිදෙනකු ; සහ

(ii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතින් පිහිටවූ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාලයකින් නම් කරණු ලබන අධ්‍යාපන, පරිපාලන, කළමනාකරණ හෝ භූ-මිතෝරු විද්‍යා ක්ෂේත්‍රයන්හි විද්වතුන් අතරින් එක් විද්වතෙක්,

අමාත්‍යවරයා විසින් පත්කළ යුතු ය.

සාමාජිකයකු වීමට නුසුදුසුකම්.

**28.** යම් තැනැත්තෙක්-

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ එසේ පත්වුවහොත් ; හෝ

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවේ නම් හෝ පුරවැසියකුව සිටීම නතර වුවහොත් ; හෝ

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල් තැනැත්තකු බවට තීරණය කරනු ලැබ හෝ ප්‍රකාශයට පත්කරනු ලැබ සිටී නම් ; හෝ

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් විසින් නියම කරන ලද බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටී නම් හෝ විඳ ඇත්නම් ; හෝ

(ඉ) සභාවේ සාමාජිකයකු වශයෙන් ඔහු විසින් ඔහුගේ කාර්යයන් ඉටුකිරීමේ දී හානිකර ලෙස බලපෑමට ඉඩ තිබෙන යම් මූල්‍යමය හෝ වෙනත් සම්බන්ධතාවක් දරයි නම් ;

(ඊ) ඔහු ගෙවිය නොහැකි බංකොලොත්භාවයකට පත්ව සිටී නම් ;

(උ) ඔහු සභාවේ අවසරය නැතිව, සභාවේ රැස්වීම් වාර තුනකට නොපැමිණ සිටී නම් ;

(ඌ) ඔහු මේ පනත යටතේ වරදකට වරදකරු යයි සොයාගනු ලැබුවහොත්,

සභාවේ සාමාජිකයකු ලෙස පත්කිරීමට හෝ කටයුතු කරගෙන යාමට හෝ නුසුදුස්සකු වනු ඇත.

සාමාජිකයන් ධූරයෙන් ඉවත් කිරීම සහ ඉල්ලා අස්වීම.

**29.** (1) සභාවේ පත්කළ සාමාජිකයකු විසින් තමා ඉල්ලා අස්වන බවට අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ස්වකීය ධූරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම, අමාත්‍යවරයා විසින් එය පිළිගනු ලැබූ දින සිට බලාත්මක විය යුතු ය.

(2) සභාවේ සාමාජිකයකු ලෙස නම් කිරීමේ අධිකාරිය විමසීමෙන් පසු පත්කළ සාමාජිකයකු අමාත්‍යවරයා විසින් ලිඛිතව හේතු දක්වා ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(3) සභාවේ පත්කළ සාමාජිකයකු මියයන, ඉල්ලා අස්වන හෝ ධූරයෙන් ඉවත් කරනු ලබන අවස්ථාවක, 27 වන වගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගෙන අමාත්‍යවරයා විසින්, ඒ සාමාජිකයා වෙනුවට වෙනත් සාමාජිකයකු පත්කරනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ පත්කරනු ලැබූ සාමාජිකයකු තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ඉතිරි ධූර කාලය සඳහා ධූර දැරිය යුතු ය.

(5) නිල බලයෙන් පත් වූ, සභාවේ සෑම සාමාජිකයෙක්ම, තමා සභාවේ සාමාජිකයකු වූයේ යම් තනතුරක් ප්‍රකාරව ද, ඒ තනතුර දරන තාක්කල් ධූර දැරිය යුතු ය.

සාමාජිකයන්ගේ ධුර කාලය.

**30.** (29) වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, සභාවේ පත්කළ සාමාජිකයකුගේ ධුර කාලය අවුරුදු තුනක් විය යුතු අතර, ඒ සාමාජිකයා නැවත පත්කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

සාමාජිකයන්ගේ පාරිශ්‍රමික හෝ දීමනා.

**31.** අමාත්‍යවරයා, මුදල් විෂයභාර අමාත්‍යවරයා විමසා තීරණය කරනු ලැබිය හැකි අනුප්‍රමාණ අනුව සභාවේ සාමාජිකයන්ට පාරිශ්‍රමික හෝ දීමනා සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ලේකම්.

**32.** (1) සභාවට සභාව විසින් පත්කරනු ලබන ලේකම්වරයකු සිටිය යුතු ය.

(2) ලේකම්වරයා සභාවේ එදිනෙදා පරිපාලන කටයුතු භාරව සිටිය යුතු ය. ලේකම්වරයා සභාවේ රැස්වීම්වලට වාර්තා පිළිබඳ ලේඛනයක් තැබිය යුතු අතර එවැනි රැස්වීම්වල කතා කිරීමට ඔහුට හිමිකමක් ඇති නමුත් ඒ රැස්වීමක දී ඡන්දය දීමට හිමිකමක් නොමැත.

සභාවේ රැස්වීම්.

**33.** (1) සභාපතිවරයා හෝ ඔහු පැමිණ නොමැතිවිට උප සභාපතිවරයා හෝ සභාවේ රැස්වීම්වල මුලසුන දැරිය යුතු ය. සභාපතිවරයා සහ උප සභාපතිවරයා යන දෙදෙනාම පැමිණ නොමැතිවිට, පැමිණ සිටින සාමාජිකයන් අතරින් පත්කරනු ලබන යම් සාමාජිකයකු ඒ රැස්වීමේ මුලසුන දැරිය යුතු ය.

(2) සභාව විසින් සභාවේ රැස්වීම්වලට අදාළ කාර්ය පරිපාටිය හා එම රැස්වීම්වල කටයුතු විධිමත් කරනු ලැබිය යුතු ය.

(3) සභාවේ රැස්වීමක ගණපූරණය සාමාජිකයන් හතර දෙනෙක් විය යුතු ය.

(4) සභාවේ යම් රැස්වීමක දී තීරණය කිරීම සඳහා වන සියලු ප්‍රශ්න පැමිණ ඇති සාමාජිකයන්ගේ බහුතරයේ ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්ද සමතාවක් ඇතිවූ විටක සභාපතිවරයාට හෝ සභාවේ රැස්වීමේ මුලසුන දරන වෙනත් සාමාජිකයකුට, තම ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

පුරප්පාඩුවක් තිබීමේ හේතුවෙන් සභාවේ ක්‍රියා නිෂ්ඵල නොවන බව.

**34.** සභාවේ යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ මණ්ඩලයේ යම් සාමාජිකයකු පත්කිරීමේ ලා යම් දෝෂයක් තිබීමේ හේතුවෙන්ම පමණක්, සභාවේ යම් ක්‍රියාවක්, තීරණයක් හෝ කටයුත්තක් බලරහිත වන ලෙස සලකනු නොලැබිය යුතු ය.

**35.** (1) සභාවේ මුද්‍රාව සභාව විසින් තීරණය කර සකස් කරනු ලැබිය හැකි අතර, එය සභාව විසින් තීරණය කරනු ලබන ආකාරයට වෙනස් කරනු ලැබිය හැකි ය. සභාවේ මුද්‍රාව.

(2) සභාවේ මුද්‍රාව, ලේකම්වරයා භාරයේ තිබිය යුතු ය.

(3) සභාවේ අවසරය ඇතිව සහ සභාවේ සභාපතිවරයා හා එක් සාමාජිකයකු ඉදිරිපිට දී හැර, සභාවේ මුද්‍රාව යම් සාධන පත්‍රයකට හෝ වෙනත් ලේඛනයකට හෝ නොතැබිය යුතු අතර තමන් පැමිණ සිටි බවට සළකුණක් වශයෙන් ඒ දෙදෙනා ඒ සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තැබිය යුතු ය.

(4) සභාවේ මුද්‍රාව තබනු ලබන සාධන පත්‍ර සහ ලේඛන පිළිබඳ රෙජිස්ටරයක් සභාව විසින් පවත්වාගෙන යා යුතු ය.

**36.** (1) සභාව විසින්, එහි බලතල හෝ කර්තව්‍ය වලින් යම් බලතල හා කර්තව්‍ය සභාවේ සභාපතිවරයා වෙත පවරා දෙනු ලැබිය හැකි ය. සභාවේ බලතල හා කර්තව්‍ය පැවරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් බලතල හා කර්තව්‍ය පවරා දෙනු ලැබූ සභාපතිවරයා විසින් එසේ තමා වෙත පවරා දෙන ලද බලතල හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හෝ ඉටුකිරීම සභාවේ පොදු හෝ විශේෂ විධිවිධානවලට යටත්ව කළ යුතු ය.

**37.** සභාවේ කර්තව්‍ය පහත දැක්වෙන පරිදි විය යුතු ය :- සභාවේ කර්තව්‍ය.

(අ) ඉඩම් මැනීමට අදාළ ප්‍රමිති හා කාර්ය පටිපාටිය පවත්වාගෙන යාම හා ඉඩම් මැනීමේ කටයුතුවල යෙදී සිටින තැනැත්තන් අතර වෘත්තීයමය විනය පවත්වාගෙන යාම ;

(ආ) ලියාපදිංචි මිනින්දෝරුවරු ලෙස ලියාපදිංචි කිරීම සඳහා මිනින්දෝරුවරුන්ගෙන් ඉල්ලුම්පත්‍ර භාරගැනීම සහ ඒ මිනින්දෝරුවරුන්ට ඉඩම් මැනීමේ කටයුතු කරගෙන යාම සඳහා නියමිත සුදුසුකම් සහ පළපුරුද්ද සහ හැකියාව සහ නිපුණතාවය ඇති බවට සභාව සෑහීමකට පත්වන අවස්ථාවන්හි දී, ඔවුන් ලියාපදිංචි කිරීම ;

(ඇ) වෘත්තියේ යෙදීමේ වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීම සඳහා ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගෙන් ඉල්ලුම්පත්‍ර භාරගැනීම සහ ඉඩම් මැනීමේ වෘත්තියෙහි යෙදීමට එම මිනින්දෝරුවන්ට දැනුම හා දක්ෂතාවය ඇති බවට සභාව සෑහීමට පත්වන අවස්ථාවන්හි දී ඔවුනට එම බලපත්‍ර නිකුත් කිරීම ;

(ඈ) ඉඩම් මැනීමේ යෙදී සිටින තැනැත්තන් අතර වෘත්තීයමය අධ්‍යාපනය පිළිබඳ උසස් ප්‍රමිතීන් පවත්වාගෙන යාම ප්‍රවර්ධනය කිරීම ;

(ඉ) මිනින්දෝරු වෘත්තියේ යෙදී සිටින සහ වාර්ෂික වෘත්තීයමය බලපත්‍ර ලබාගැනීමට නියම කරන ලද තැනැත්තන්ගේ දැනුම හා දක්ෂතා වැඩිදියුණු කිරීමේ කාර්ය සඳහා වෘත්තීයමය සංවර්ධන වැඩ සටහන් ප්‍රවර්ධනය කිරීම ;

(ඊ) ඉඩම් මැනීම පිළිබඳ ශාස්ත්‍රීය හා වෘත්තීයමය සුදුසුකම් පිළිගැනීම, ප්‍රායෝගික පළපුරුද්ද පිළිබඳ අවශ්‍යතා නියම කිරීම සහ ලියාපදිංචි මිනින්දෝරුවන් ලෙස ලියාපදිංචි වීමට සහ වාර්ෂික වෘත්තීයමය බලපත්‍ර නිකුත් කිරීම සඳහා වූ අපේක්ෂකයන් වෙනුවෙන් සුදුසුකම් ලැබීමේ විභාග හා වෘත්තීයමය සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම ;

(උ) ඉඩම් මැනීමෙහි යෙදී සිටින තැනැත්තන්ගේ අධ්‍යාපනය, පුහුණුව හා පිළිගැනීම යන කරුණුවල දී සම සම්බන්ධයක් සහ අන්‍යොන්‍යතාවයක් ස්ථාපිත කිරීම සඳහා විදේශීය රටවල බලධරයන් සමග අන්‍යොන්‍ය වැඩ පිළිවෙළවල් සඳහා එකඟතාවය ඇති කර ගැනීම හා ක්‍රියාත්මක කිරීම ;

(ඌ) නියම කරන ලද අධ්‍යාපන ප්‍රමිතීන් පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකාවේ ඉඩම් මැනුම් කටයුතු හා ඉඩම් තොරතුරු පිළිබඳව නියැලී සිටින ආයතන සමග සම්බන්ධීකරණය කිරීම ;

(එ) උසස් වෘත්තීයමය ප්‍රමිතීන් පවත්වාගෙන යාමේ දී ශ්‍රී ලංකාවේ වෙනත් අදාළ සංවිධාන සමග සම්බන්ධීකරණය කිරීම.

**38.** සභාවට පහත සඳහන් බලතල ඇත්තේ ය :- සභාවේ බලතල.

(අ) යම් චංචල හෝ නිශ්චල දේපළ අත්කර ගැනීම, දැරීම, බද්දට ගැනීම හෝ බද්දට දීම, උකස් කිරීම, හුවමාරු කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ආ) මුදලින් හෝ අන්‍යාකාරයේ වූ ත්‍යාග, ප්‍රදාන හෝ පරිත්‍යාග භාරගැනීමට සහ ස්වකීය කාර්යවා ඉටු කිරීම සඳහා ඒවා යොදා ගැනීම ;

(ඇ) සභාවේ කටයුතු කරගෙන යෑම සඳහා අවශ්‍ය නිලධරයන් හා සේවකයන් පත්කිරීම ;

(ඈ) එසේ පත්කරන ලද නිලධරයන්ට සහ සේවකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික නිර්ණය කිරීම ;

(ඉ) ස්වකීය කාර්යයන් ඵලදායී ලෙස ඉටුකිරීම සඳහා කමිටු පත්කිරීම ;

(ඊ) ස්වකීය නිලධරයන් හා සේවකයන් සඳහා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයක් පිහිටුවීම සහ සුභ සාධන හා ක්‍රීඩා පහසුකම් සැපයීම ;

(උ) සභාවේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් රීති සෑදීම ; සහ

(ඌ) සාමාන්‍යයෙන් සභාවේ කාර්යවා නිසිපරිදි ඉටු කිරීම පහසු කරලීම සඳහා අවශ්‍යවන වෙනත් සියලු දේ කිරීම.

**39.** (1) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දින සිට හෝ එදිනට පසුව මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති සුදුසුකම් ඇති සහ සභාවේ ලියාපදිංචිය ලබාගෙන තත්කාලයේ බලපවත්නා ලියාපදිංචිවීමේ සහතිකයක් නිකුත්කරනු ලැබ ඇති තැනැත්තන් හැර වෙනත් කිසිම තැනැත්තකු ඉඩම් මැනීමේ නොයෙදිය යුතු ය. මිනින්දෝරුවරුන් සභාවේ ලියාපදිංචි විය යුතු බව.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වූවද, මෙහි උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති ශාස්ත්‍රීය සුදුසුකම්

ඇති සහ (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචිවීමේ සහතිකයක් නිකුත් කරනු ලැබ ඇති තැනැත්තකුගේ පරීක්ෂණය යටතේ වැඩ කරන යම් තැනැත්තෙකු මෙහි උපලේඛනයේ නියම කොට දක්වා ඇති ප්‍රායෝගික සුදුසුකම් ලබාගැනීමේ කාර්ය සඳහා ඉඩම් මැනීමෙහි යෙදිය හැකි නමුත් මේ පනත යටතේ ලියාපදිංචිවීම සඳහා ඔහු සුදුස්සකු නොවිය යුතු ය.

(3) මිනින්දෝරුවරයකු ලෙස ලියාපදිංචිවීම සඳහා වූ ඉල්ලීමක් නියමිත ආකෘති පත්‍රයේ විය යුතු අතර, ඊ සමග නියමිත ගාස්තුව ද ඉදිරිපත් කළ යුතු ය.

(4) ඉඩම් මැනීමෙහි යෙදී සිටින හෝ එසේ යෙදී සිටීමට අපේක්ෂිත තැනැත්තකු විසින් තත්කාර්ය සඳහා ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් ලැබීමේ දී සහ හොඳ චරිතයක් ඇති බවට සාක්ෂි ඉදිරිපත් කිරීමේ දී ද සහ නියමිත ගාස්තු ගෙවීමේ දී ඉඩම් මැනීමේ යෙදීම සඳහා එම තැනැත්තාට සුදුසුකම්, පළපුරුද්ද සහ දක්ෂතා ඇති බවට සභාව සෑහීමට පත්වන අවස්ථාවක සභාව විසින් එම තැනැත්තා ලියාපදිංචි කරනු ලැබිය හැකි ය.

මිනින්දෝරු ආඥාපනත යටතේ බලපත්‍රයක් නිකුත් කිරීමට හිමිකම් ඇති මිනින්දෝරුවරුන් ලියාපදිංචි වී ඇති ලෙස සලකනු ලැබිය යුතු බව.

40. (1) 39 වෙනි වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුවද, මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයේ දී මිනින්දෝරු ආඥාපනතේ 4 වන වගන්තිය හෝ 6 වන වගන්තිය යටතේ වාර්ෂික බලපත්‍රයක් නිකුත් කරනු ලැබීමට හිමිකම් ඇති සෑම මිනින්දෝරුවරයකුම මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ ලෙස සලකනු ලබන සෑම මිනින්දෝරුවරයකුම හැකි පහසු ඉක්මනින් පහත දැක්වෙන විස්තර සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය :-

(අ) මිනින්දෝරුවරයාගේ නම සහ ලිපිනය ;

(ආ) මිනින්දෝරු ආඥාපනත යටතේ වාර්ෂික බලපත්‍රයක් ලබාගැනීමට මිනින්දෝරුවරයාට හිමිකම් ලැබුණේ යම් උපාධින හෝ සුදුසුකම් මත ද එම උපාධින හෝ සුදුසුකම්.

(3) 39 වන වගන්තියේ (3) හෝ (4) වන උපවගන්ති යටතේ සභාව වෙත ලියාපදිංචි වී ඇති හෝ (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි වී ඇති ලෙස සලකනු ලබන සෑම

මිනින්දෝරුවරයකුටම ලියාපදිංචිවීමේ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු අතර ඔහුට මේ පනතෙහි "ලියාපදිංචි මිනින්දෝරුවරයා" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

**41.** (1) ඉඩම් මැනීමේ වෘත්තියේ යෙදීමට කැමැත්තාවූ හෝ ඒ සඳහා උත්සාහ කරන්නාවූ හෝ ප්‍රගුණ කරන්නාවූ හෝ සෑම ලියාපදිංචි මිනින්දෝරුවරයකුම වෘත්තියේ යෙදීමේ වාර්ෂික බලපත්‍රයක් සඳහා සභාව වෙත ඉල්ලුම් කළ යුතු ය : වෘත්තියේ යෙදීමේ වාර්ෂික බලපත්‍රය.

එසේ වුව ද, සර්වේයර් ජනරාල්වරයාගේ අධීක්ෂණය යටතේ ඉඩම් මැනීමේ වෘත්තියෙහි යෙදී සිටින මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි මිනින්දෝරුවන්ට ආණ්ඩුව වෙනුවෙන් ඉඩම් මැනීමේ වෘත්තියෙහි යෙදීමේ කාර්ය සඳහා වෘත්තියේ යෙදීමේ වාර්ෂික බලපත්‍රයක් ලබාගැනීම අවශ්‍ය නොවේ.

(2) නියමිත ගාස්තුව සමග ලියාපදිංචි මිනින්දෝරුවරයකු විසින් තත්කාර්ය සඳහා ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් සභාව වෙත ලැබීමේ දී සභාව විසින් අනුමත කරන ලද නියමිත අධ්‍යයන පාඨමාලාව සහ පුහුණුව ඔහු විසින් ලබා ඇති බවට ද ඉඩම් මැනීමේ වෘත්තියේ යෙදීමට අවශ්‍ය දැනුම හා දක්ෂතාවය ඔහු විසින් ලබා ඇති බවට ද සභාව සෑහීමකට පත්වන අවස්ථාවක දී සභාව විසින් වෘත්තියේ යෙදීමේ වාර්ෂික බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තියේ කුමක් සඳහන් වුවද, මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයේ දී ඉඩම් මැනීමෙහි යෙදී සිටින සෑම ලියාපදිංචි මිනින්දෝරුවරයකුම එම දින සිට මාස හයක කාලයක් සඳහා ඉඩම් මැනීමේ වෘත්තියේ යෙදිය හැකි නමුත්, ඒ කාල සීමාව තුළ දී මේ පනත යටතේ වූ වෘත්තියේ යෙදීමේ වාර්ෂික බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කළ යුතු ය.

(4) (2) වන උපවගන්තිය යටතේ වෘත්තියේ යෙදීමේ වාර්ෂික බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති සෑම ලියාපදිංචි මිනින්දෝරුවරයකුම මේ පනතෙහි "ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරයා" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

**42.** (1) සභාව විසින් සියලුම :- මිනින්දෝරුවරුන්ගේ නාම ලේඛනය.

(අ) ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ ; සහ

(ආ) ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරුන්ගේ,

නාමලේඛනයක් පවත්වාගෙන යා යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පවත්වාගෙන යනු ලබන නාම ලේඛනවල සියලුම ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ සහ සියලුම ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරුන්ගේ නම්, සුදුසුකම්, සහ ලිපිනයන් ද ඔවුන් ලියාපදිංචි කරනු ලැබූ හෝ ඔවුන් වෙත බලපත්‍ර නිකුත් කරනු ලැබූ දිනයන් සහ මේ පනත යටතේ පවත්වාගෙන යාමට නියම කරන ලද වෙනත් විස්තර ද අන්තර්ගත විය යුතු ය.

(3) යම් තැනැත්තකු විසින් පරීක්ෂා කිරීම සඳහා නියමිත ගාස්තුව ගෙවීම මත ඒ ලේඛන මහජනයා වෙත විවෘතව තැබිය යුතු ය.

(4) යම් නාම ලේඛනයක අන්තර්ගත යම් සටහනක සහතික පිටපතක් ඉල්ලා සිටින යම් තැනැත්තකුට නියමිත ගාස්තුවක් ගෙවීමේ දී සභාව විසින් එම පිටපත සැපයිය යුතු ය.

නාම ලේඛනයේ පිටපතක් පළකළ යුතු බව.

**43.** (1) සෑම වර්ෂයකම මාර්තු මස තිස් එක්වන දින හෝ ඊට පෙර සභාව විසින් සියලු ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරුන්ගේ නම් ලැයිස්තුවක් ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර, වෘත්තියෙහි යෙදීමේ වාර්ෂික බලපත්‍රයක් අවලංගු කිරීමේ හෝ අත්හිටුවීමේ දින සිට එක් මාසයක් ඇතුළත ඒ පිළිබඳව දැනුම් දෙමින් ගැසට් පත්‍රයේ නිවේදනයක් පළකළ යුතු ය.

(2) සභාව විසින් අවශ්‍ය යයි සලකනු ලබන අවස්ථාවක දී ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ නාමලේඛනය හෝ එහි කොටසක් ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමට සලස්වනු ලැබිය යුතු ය.

(3) සභාවේ සභාපතිවරයා විසින් සහතික කරනු ලැබ ඇති බවට උද්දේශිත එවැනි යම් ලේඛනයක අන්තර්ගත යම් සටහනක පිටපතක් කවර හෝ නඩු කටයුත්තක දී එම තැනැත්තා-

(අ) ලියාපදිංචි මිනින්දෝරුවකු බවට ;

(ආ) අවස්ථාවෝචිත පරිදි වෘත්තියේ යෙදීමේ වාර්ෂික බලපත්‍රයක් දරන බවට හෝ නොදරන බවට ;

(ඇ) එහි සඳහන් සුදුසුකම් ඔහුට ඇති බවට ;

(ඈ) අවස්ථාවෝචිත පරිදි ඔහුගේ ලියාපදිංචිය අවලංගු කරනු ලැබූ බවට නැතහොත් අත්හිටුවනු ලැබූ බවට ; හෝ

(ඉ) අවස්ථාවෝචිත පරිදි ඔහුගේ වෘත්තියේ යෙදීමේ වාර්ෂික බලපත්‍රය අවලංගු කරනු ලැබ ඇති බවට හෝ අත්හිටුවනු ලැබ ඇති බවට,

එහි සඳහන් කරුණු බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

44. ලියාපදිංචි මිනින්දෝරුවරයකු විසින් - ලියාපදිංචි මිනින්දෝරුවරයකුගේ බලතල.

(අ) ආණ්ඩුවේ සේවයෙහි යෙදෙමින් සිටින විට දී සහ සර්වේයර් ජනරාල්වරයා විසින් බලය පවරනු ලැබූ විට දී ඉඩම් මැනුම්කරණයේ යෙදිය හැකි ය ; නැතහොත්

(ආ) වෘත්තියේ යෙදීමේ වාර්ෂික බලපත්‍රයක් දරන විට දී ගාස්තුවක් හෝ ත්‍යාගයක් සඳහා ඉඩම් මැනීමේ වෘත්තියේ යෙදිය හැකි ය.

45. (1) මේ කොටසේ කාර්ය සඳහා ලියාපදිංචි මිනින්දෝරුවරයකු යම් කිසි කාරණයක දී හෝ අභියාචනයක දී- වෘත්තීය විෂමාචාර.

(අ) යම් මැනුමක් සිදුකිරීමේ දී නොසැලකිලිමත් වී ඇති බවට හෝ අකාර්යක්ෂම වී ඇති බවට ;

(ආ) මැනුම් වෘත්තියෙහි යෙදීමට අදාළ යම් මාර්ගෝපදේශවලට හෝ විධානවලට නැතහොත් නියමිත පිඹුරු හා කැඩැස්තර සිතියම් සකස් කිරීමට හා පවත්වාගෙන යාමට අදාළ නියම කරනු ලබන අවශ්‍යතාවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර ඇති බවට ;

(ඇ) යම් මැනුමක හෝ මැනුමකට අදාළ පිඹුරක හෝ සිතියමක නිරවද්‍යතාව සහතික කර ඇති බවට-

(i) එවැනි යම් මිනින්දෝරුවරයකු රජයේ සේවයේ නිලධරයකු වන අවස්ථාවක, ඔහු නිසි සැලකිල්ලෙන් හා අවධානයෙන් තොරව මැනුම සිදුකර ඇති බවට හෝ පිඹුරු හෝ සිතියම් සහතික කර ඇති බවට ;

(ii) ඒ මිනින්දෝරුවරයා ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරයකුව සිටිමින් -

(අ) නිසි සැලකිල්ලෙන් හෝ අවධානයෙන් තොරව මැනුම් සිදුකර ඇති බවට හෝ ඒ පිඹුර හෝ සිතියම සකස් කර ඇති බවට ;

(ආ) යම් මැනුමක් පෞද්ගලිකව තමා විසින් සිදු නොකර, එය වෙනත් ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරයකු මගින් සිදුකිරීමට කටයුතු සලස්වා එම මිනින්දෝරුවරයාගේ ක්ෂේත්‍ර කටයුතු සහ කාර්යාල කටයුතුවල නිරවද්‍යතාව තහවුරු කිරීමට ප්‍රමාණවත් පියවර නොගත් බවට ;

(ඇ) ඒ මැනුම පෞද්ගලිකව තමා විසින් සිදු නොකර, එය ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරයකු නොවන තැනැත්තකු විසින් සිදුකිරීමට කටයුතු සැලැස් වූ බවට ;

(ඈ) ඒ මැනුම, සිතියම හෝ පිඹුර දෝෂ සහිත බව දැන දැනම එහි නිරවද්‍යතාවය පිළිබඳව සහතික කර ඇති බවට ;

(ඈ) ක්ෂේත්‍රයේ දී කරනු ලැබූ නිරීක්ෂණ වලින් හෝ මැනුම් වලින් උපුටා ගන්නා ලදැයි උද්දේශිත එහෙත් ඇත්ත වශයෙන්ම එසේ උපුටා නොගන්නා ලද අවස්ථාවක සටහනක් යම් ක්ෂේත්‍ර පොතක හෝ වෙනත් වාර්තාවක සටහන් කර ඇති බවට ;

(ඉ) යම් මැනුමකට, මැනුම් සලකුණකට හෝ මායිමකට අදාළ යම් වැරදි තොරතුරක්, එම තොරතුර වැදගත් කරුණක් සම්බන්ධයෙන් වැරදි සහගත බව දැන දැනම සර්වේයර් ජනරාල්වරයාට හෝ වෙනත් යම් ලියාපදිංචි මිනින්දෝරුවරයකුට සපයා ඇති බවට ;

(ඊ) සාධාරණ හේතුවක් නොමැතිව මේ පනත යටතේ ලියාපදිංචි මිනින්දෝරුවරයකුට පනවා ඇති යම් කාර්යයක් ඉටුකිරීමට අපොහොසත් වී ඇති බවට හෝ ඉඩම් මැනීමේ වෘත්තියෙහි යෙදීම සඳහා සභාව විසින් ඔහුට අවසර දී ඇත්තේ යම් කොන්දේසියකට යටත්ව ද ඒ කොන්දේසියට එකඟව ක්‍රියාකිරීමට අපොහොසත් වී ඇති බවට,

තීරණය කරනු ලැබුවහොත්, ඒ ලියාපදිංචි මිනින්දෝරුවරයා වෘත්තීය විෂමාචාරයකට වරදකරු විය යුතු ය.

(2) යම් ලියාපදිංචි මිනින්දෝරුවරයකු වෘත්තීය විෂමාචාරයකට වරදකරු හෝ නිවැරදිකරු බවට තීරණය කිරීමේ කාර්යය සඳහා යම් මැනුම් පිඹුරක් හෝ සිතියමක් සර්වේයර් ජනරාල්වරයා විසින් හෝ ඔහු වෙනුවෙන් අනුමත කරනු ලැබ තිබීමේ සිද්ධිමය කරුණ අදාළ නොවිය යුතු ය.

46. (1) ලියාපදිංචි මිනින්දෝරුවරයකුට එරෙහිව වූ වෘත්තීය විෂමාචාරය පිළිබඳව වූ සෑම චෝදනාවක්ම චෝදනාව ඉදිරිපත් කරන තැනැත්තා විසින් අත්සන් කොට සභාව වෙත ලිඛිතව වාර්තා කළයුතු අතර. එම චෝදනාව පිළිබඳව පරීක්ෂණයක් පැවැත්විය යුතු බව සභාවට පෙනීයන්නේ නම් එවැනි පරීක්ෂණයක් පිළිබඳව දිනය හා ස්ථානය සභාව විසින් නියම කරනු ලැබිය යුතු ය.

ලියාපදිංචි මිනින්දෝරුවරයකුට එරෙහිව වූ චෝදනාවක් සභාව වෙත වාර්තා කළ යුතු බව.

(2) (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි මිනින්දෝරුවරයකුට එරෙහිව වෘත්තීය විෂමාචාරය පිළිබඳව වූ යම් චෝදනාවකට අදාළව පරීක්ෂණයක් සභාව විසින් පැවැත්විය යුතු අතර, අවශ්‍ය අවස්ථාවන්හි දී, ඉඩම් මැනීමේ හෝ වෙනත් යම් ක්ෂේත්‍රයක නිපුණතා ඇති යම් තැනැත්තකුගේ සේවය පරීක්ෂණය පැවැත්වීමේ දී සභාවට සහායවීම පිණිස සභාව විසින් ලබාගත යුතු ය.

(3) ඒ පරීක්ෂණය සඳහා නියම කරන ලද දිනයට අවම වශයෙන් දින විසිඑකකට පෙර පරීක්ෂණය සඳහා නියම කරන ලද වේලාව සහ ස්ථානය චූදිත තැනැත්තා වෙත දැනුම් දෙමින් ලිඛිත දැන්වීමක් ලේකම්වරයා විසින් ඒ මිනින්දෝරුවරයාගේ අවසන්වරට දැන සිටි තැපැල් ලිපිනයට යැවිය යුතු අතර, ඒ දැන්වීම සමඟ ඔහුට එරෙහිව ඇති සියලු චෝදනාවල පිටපතක් ද ඔහු වෙත යැවිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ පවත්වනු ලබන පරීක්ෂණයක දී–

(අ) චූදිත මිනින්දෝරුවරයාට ඔහුගේ විත්ති වාචක ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාවක් ලබා ගැනීමට හිමිකම් තිබිය යුතු ය ; සහ

(ආ) සභාව–

(i) විධිමත් හා නෛතික ප්‍රතිමාන නොසලකා, සාධාරණ ලෙස ද හෘද සාක්ෂියට එකඟව ද සහ පරීක්ෂණයේ කරුණුවල යථාර්ථවත් හරි වැරදිභාවයට අනුකූලව ද ක්‍රියාකළ යුතු ය ; තවද

(ii) සාක්ෂි පිළිබඳ රීති වලින් බැඳී නොසිටිය යුතු නමුත්, යම් කාරණාවක් මත එය විසින් යුක්ත යයි කල්පනා කරන ආකාරයට එය විසිනම තොරතුරු ලබාගත හැකි ය.

(5) ඒ පරීක්ෂණය පිළිබඳව සභාවේ තීරණය ලිඛිතව දැන්විය යුතු අතර, ඒ තීරණය යටත් පිරිසෙන් ඒ පරීක්ෂණය පවත්වනු ලැබූ සභාවේ සාමාජිකයන් දෙදෙනකු විසින්වත් අත්සන් කළ යුතු ය. තව ද ලේඛම්වරයා විසින් එහි අනු අත්සන යෙදිය යුතු ය.

(6) සභාව විසින් පරීක්ෂණය පිළිබඳව ස්වකීය තීරණය සඳහා වූ හේතු දැක්විය යුතු ය.

සභාවේ විනය බලතල.

47. (1) මේ කොටසට අනුකූලව පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසු ලියාපදිංචි මිනින්දෝරුවරයකු වෘත්තීය විෂමාචාරයට වරදකරු වී ඇති බවට සභාව සෑහීමට පත්වන අවස්ථාවක දී සභාව විසින් පහත සඳහන් නියමයන්ගෙන් එකක් හෝ ඊට වැඩි ගණනක් කරනු ලැබිය හැකි ය :–

(අ) ලියාපදිංචි මිනින්දෝරුවරයාගේ ලියාපදිංචිය අවලංගු කොට ඒ මිනින්දෝරුවරයාගේ නම, නාම ලේඛනයෙන් ඉවත් කරන ලෙස වූ නියමයක් කිරීම ;

(ආ) ලියාපදිංචි මිනින්දෝරුවරයාගේ ලියාපදිංචිය අවුරුදු තුනකට නොවැඩි කාලයක් සඳහා අත්හිටුවන ලෙස වූ නියමයක් කිරීම ;

(ඇ) ලියාපදිංචි මිනින්දෝරුවරයකුට හිකුත් කරන ලද වෘත්තියෙහි යෙදීමේ වාර්ෂික බලපත්‍රය අවලංගු කරන ලෙසට වූ නියමයක් කිරීම ;

(ඈ) ලියාපදිංචි මිනින්දෝරුවරයකුට නිකුත් කරන ලද වෘත්තියෙහි යෙදීමේ වාර්ෂික බලපත්‍රයක් අත්හිටුවන ලෙසට වූ නියමයක් කිරීම ;

(ඉ) සභාව විසින් පනවනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව අවුරුදු තුනකට නොවැඩි කාලයක් සඳහා ඉඩම් මැනීමේ වෘත්තියේ යෙදීමට ලියාපදිංචි මිනින්දෝරුවරයාට හැකි නවට වූ නියමයක් කිරීම ;

(ඊ) ගාස්තු පිළිබඳව හෝ සභාව විසින් උචිත යයි සලකනු ලබන අනාකාර වූ, වෙනත් යම් උචිත නියමයක් කිරීම.

(2) මේ වගන්තිය යටතේ වූ ලියාපදිංචිය අත්හිටුවීමේ නියමයක් බලාත්මකව පවතින විට ඒ තැනැත්තා මේ පනතේ කාර්ය සඳහා ලියාපදිංචි නොවූ තැනැත්තකු ලෙස සලකනු ලැබිය යුතු ය. නමුත් ඒ නියමය අවසන් වූ වහාම එසේ අවසන්වීමේ දින සිට ලියාපදිංචි මිනින්දෝරුවරයකු ලෙස ඔහුගේ අයිතිවාසිකම් සහ වරප්‍රසාද නැවත ලබාදිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ ගෙවිය යුතු සියලු ගාස්තු සහ වියදම් සභාවට අයවිය යුතු ණයක් වශයෙන් සභාව විසින් අයකරගනු ලැබිය යුතු ය.

**48.** 46 වන වගන්තිය යටතේ පරීක්ෂණයක් පවත්වනු ලබන්නේ යම් ලියාපදිංචි මිනින්දෝරුවරයකු සම්බන්ධයෙන් ද එවැනි සෑම ලියාපදිංචි මිනින්දෝරුවරයකුට ම පරීක්ෂණයේ දී තමා පෞද්ගලිකව ම හෝ නියෝජිතයකු මාර්ගයෙන් පෙනී සිට කරුණු ඉදිරිපත් කිරීමට හිමිකමක් තිබිය යුතු ය. පරීක්ෂණයකට භාජන වී ඇති ලියාපදිංචි මිනින්දෝරුවරයාට කරුණු ඉදිරිපත් කිරීමට ඇති අයිතිය.

සභාවේ තීරණවලට එරෙහිව අභියාචනා.

**49.** (අ) ලියාපදිංචිවීම සඳහා හෝ වෘත්තියේ යෙදීමේ වාර්ෂික බලපත්‍රයක් නිකුත් කිරීමට, තමා විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීමකට අදාළව සභාව විසින් ගන්නා ලද යම් තීරණයකින් ;

(ආ) තමාට අදාළව 47 වන වගන්තිය යටතේ සභාව විසින් කරන ලද යම් නියමයකින්,

අසාප්පියට පත් සෑම තැනැත්තෙක් ම ඒ තීරණය හෝ නියමය ලේකම්වරයා විසින් තමාට දැනුම් දී දින තිහක් ඇතුළත, අවස්ථාවෝචිත පරිදි, ඒ තීරණයට හෝ නියමයට එරෙහිව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය.

අවලංගු කිරීම හෝ අත්හිටුවීම හෝ කොන්දේසි නාම ලේඛනයෙහි ඇතුළත් කළ යුතු බව.

**50.** යම් මිනින්දෝරුවරයකුගේ ලියාපදිංචිය හෝ වෘත්තියෙහි යෙදීමේ වාර්ෂික බලපත්‍රය හෝ ඒ දෙකම අවලංගු කර ඇති බව සහ 47 වන වගන්තිය යටතේ ඉඩම් මැනීමේ වෘත්තියෙහි යෙදීම සඳහා ඔහු වෙත පනවන ලද යම් කොන්දේසියක් ඇතොත් ඒ කොන්දේසිය නාමලේඛනයේ අදාළ මිනින්දෝරුවරයා පිළිබඳ සටහනට ඉදිරියෙන් ලේකම්වරයා විසින් නාම ලේඛනයෙහි ඇතුළත් කළ යුතු ය.

සහතික භාරදීම.

**51.** (1) මේ පනතේ මේ කොටස යටතේ ලියාපදිංචිය හෝ වෘත්තියෙහි යෙදීමේ වාර්ෂික බලපත්‍රය අවලංගු කරනු ලැබූ නැතහොත් අත්හිටුවනු ලැබූ සෑම ලියාපදිංචි මිනින්දෝරුවරයකු ම, අවස්ථාවෝචිත පරිදි, අවලංගු කිරීම හෝ අත්හිටුවීම පිළිබඳ ලිඛිත දැන්වීම ඔහු වෙත භාර දෙනු ලැබූ දින සිට දින දාහතරක් ඇතුළත, ඒ දිනයට පෙර ලේකම්වරයා වෙත භාරදෙනු නොලැබූ සහතික ලේකම්වරයා වෙත භාරදිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියාකිරීම පැහැර හරින සෑම ලියාපදිංචි මිනින්දෝරුවරයකු ම මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් දසදහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

කමිටු.

**52.** (1) 37 වන වගන්තිය සහ 46 වන වගන්තිය මගින් සභාව වෙත පවරා ඇති කාර්යය හැර සභාවේ කාර්යවල විෂය පථයට ගැනෙන යම් කරුණක් පිළිබඳව පරීක්ෂාකොට

සභාව වෙත වාර්තා කිරීම සඳහා සභාවේ සාමාජිකයන් තුන්දෙනකුට නොඅඩු සංඛ්‍යාවකින් සහ සභාව විසින් සුදුසු යයි සලකන වෙනත් යම් තැනැත්තන්ගෙන් සමන්විත වන කමිටු සභාව විසින් කලින් කල පත්කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත්කරනු ලබන සෑම කමිටුවක් ම සියලු කරුණුවල දී සභාවේ පාලනයට යටත් විය යුතු ය.

**53.** (1) සභාවේ කාර්ය සහ කර්තව්‍ය ඉටුකිරීම සම්බන්ධයෙන් ද බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ද සභාව විසින් සෑම වර්ෂයකම අමාත්‍යවරයා වෙත වාර්තාවක් සැපයිය යුතු ය. වාර්ෂික වාර්තාව.

(2) ඒ වාර්තාවේ පිටපතක් අමාත්‍යවරයා වෙත ලැබුණු පසු හැකි පහසු ඉක්මනින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

**54.** (1) ඉඩම් මැනීමේ වෘත්තියෙහි තම දැනුම සහ දක්ෂතා පවත්වාගෙන යාමේ සහ වැඩි දියුණු කිරීමේ කාර්ය සඳහා නියමිත කාල සීමාවක් ඇතුළත නියමිත පළපුරුද්දක් ලබා ගැනීම සඳහා නියමිත පාඨමාලා හදාරන ලෙස හෝ වෙනත් උචිත කාර්ය කරන ලෙස සභාව විසින් ලියාපදිංචි මිනින්දෝරුවරුන්ට නියම කරනු ලැබිය හැකි ය. අධ්‍යාපන කටයුතු දිගටම පවත්වාගෙන යාම.

(2) (අ) වෘත්තියෙහි යෙදීමේ වාර්ෂික බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති ලියාපදිංචි මිනින්දෝරුවරයකු (1) වන උපවගන්තිය යටතේ පනවා ඇති නියමයන්ගෙන් යම් නියමයකට එකඟව ක්‍රියාකර නොමැති බවට සභාව සෑහීමකට පත්වන අවස්ථාවක දී සභාව විසින්-

(i) නියමයන්ට අනුකූලව ක්‍රියාකරනතුරු, ඒ ලියාපදිංචි මිනින්දෝරුවරයාගේ වෘත්තියෙහි යෙදීමේ වාර්ෂික බලපත්‍රය අත්හිටුවනු ලැබිය හැකි ය ;

(ii) එවැනි ලියාපදිංචි මිනින්දෝරුවරයකුගේ වෘත්තියෙහි යෙදීමේ වාර්ෂික බලපත්‍රය නියමිත කොන්දේසිවලට යටත්ව අලුත්

කරනු ලැබිය හැකි ය. ඒ කොන්දේසිවලට වෘත්තියේ යෙදීමේ බලපත්‍රය අලුත් කරනු ලබන්නේ සම්මත කාල පරිච්ඡේදයකට බව යන කොන්දේසිය ද ඇතුළත් විය හැක ;

(iii) ඒ නියමයන්ට අනුකූලව ක්‍රියාකරන තුරු ඒ ලියාපදිංචි මිනින්දෝරුවරයාගේ වෘත්තියේ යෙදීමේ වාර්ෂික බලපත්‍රය අලුත් කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය ; නැතහොත්

(ආ) (1) වන උපවගන්තිය යටතේ පනවන ලද නියමයන්ට රජයේ සේවයේ යෙදී සිටින ලියාපදිංචි මිනින්දෝරුවරයකු එකඟව ක්‍රියාකර නොමැති බවට සභාව සෑහීමකට පත්වන අවස්ථාවක එකඟව ක්‍රියා නොකිරීම පිළිබඳව උචිත ක්‍රියා මාර්ගයක් සඳහා සභාව විසින් එම කරුණ සර්වේයර් ජනරාල්වරයා වෙත වාර්තා කළ යුතු ය.

සභාවේ කාර්ය මණ්ඩලය.

**55.** (1) සභාවේ කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ඉටුකිරීම සඳහා අවශ්‍ය යයි සභාව සලකනු ලබන නිලධරයන් සහ සේවකයන් සභාව විසින් පත්කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත්කරනු ලැබූ නිලධරයන්ට සහ සේවකයන්ට අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව සභාව විසින් නිර්ණය කරනු ලැබිය හැකි ආකාරයට සහ යම් අනු ප්‍රමාණයක් අනුව පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු අතර, ඒ නිලධරයන් හා සේවකයන් අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව සභාව විසින් නිර්ණය කරන සේවා කොන්දේසිවලට යටත් විය යුතු ය.

(3) සභාවේ ඉල්ලීම පිට, යම් රජයේ නිලධරයකු, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව, සභාවේ කාර්ය මණ්ඩලයට, සභාව විසින් එවැනිම කැමැත්ත ඇතිව නිර්ණය කරනු ලබන කාල සීමාවක් සඳහා තාවකාලිකව පත්කරනු ලැබිය හැකි ය ; නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත්කරනු ලැබිය හැකි ය.

(4) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු සභාවේ කාර්ය මණ්ඩලයට, තාවකාලිකව පත්කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස්කම් සහිතව, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(5) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු සභාවේ කාර්ය මණ්ඩලයට, ස්ථිරව පත්කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස්කම් සහිතව, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(6) නියමිත කාලසීමාවක් සඳහා රජයට සේවය කිරීමට එකඟ වූ යම් තැනැත්තකු, සභාව විසින් සේවයේ යොදවනු ලබන අවස්ථාවක, එම තැනැත්තා සභාව වෙත කරනු ලබන සේවා කාල සීමාවක් එම ගිවිසුමේ බැඳීම් ඉටුකිරීමේ කාර්ය සඳහා රජයට කරනු ලබන සේවාවක් ලෙස සලකනු ලැබිය යුතු ය.

**56.** (1) (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) සභාවේම අරමුදලක් සභාවට තිබිය යුතු ය. සභාවේ අරමුදල

(2) ඒ අරමුදලට පහත දැක්වෙන මුදල් බැර කරනු ලැබිය යුතු ය :-

(අ) සභාවට, ඒකාබද්ධ අරමුදලින් ලබාදෙනු ලැබිය හැකි සියලු මුදල් ;

(ආ) මේ පනත යටතේ සභාවට දී ඇති සියලු බලතල හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටුකිරීමේ දී සභාව වෙත ලැබෙන සියලුම මුදල් ;

(ඇ) තෑගි, ප්‍රදාන හෝ පරිත්‍යාග වශයෙන් සභාවට ලැබෙන සියලු මුදල්.

(3) මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ ප්‍රදානය බලතල හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටුකිරීමේ දී සභාව විසින් දරනු ලබන වියදම් ගෙවීම සඳහා අවශ්‍ය සියලු මුදල් සහ අරමුදලින් ගෙවිය යුතු යයි නියමිත සියලු මුදල්, අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය.

**57.** (1) සභාවේ මුදල් වර්ෂය දින වර්ෂය විය යුතු ය.

(2) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය පිළිබඳව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ අන්තර්ගත විධිවිධාන සභාවේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් ද අදාළ වන්නේ ය.

වාර්තා සහ තොරතුරු.

**58.** (1) මේ පනත යටතේ සභාවේ බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට හා ඉටුකිරීමට සභාවට හැකිවන පිණිස සභාව විසින් හෝ තත්කාර්ය සඳහා සභාව විසින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් ලිඛිත නිවේදනයක් මගින්, ඒ නිවේදනයෙහි නිශ්චිතව සඳහන් කාල පරිච්ඡේදය තුළ, මුල් ක්ෂේත්‍ර සටහන් සහ පිඹුරු හෝ සිතියම් ද ඇතුළත්ව යම් මිනින්දෝරුවරයකු විසින් දන්නා හෝ ඔහුගේ සන්තකයේ ඇති ඔහුගේ මැනුම් කටයුතුවලට අදාළ සියලු වාර්තා හා තොරතුරු සභාව වෙත හෝ සභාව විසින් බලය දෙනු ලැබූ තැනැත්තා වෙත හෝ සපයන ලෙස යම් ලියාපදිංචි මිනින්දෝරුවරයකුට නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක් මගින් යම් වාර්තාවක් හෝ තොරතුරක් ඉදිරිපත් කිරීමට නියමිතව ඇති මිනින්දෝරුවරයකු වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ එම වාර්තා ඉදිරිපත් කිරීමට හෝ එම තොරතුරු හෙළි කිරීම වළක්වනු ලැබ ඇත්නම් මිස, එම දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති කාල සීමාව ඇතුළත එම වාර්තාව හෝ තොරතුරු ඉදිරිපත් කිරීම එවැනි සෑම මිනින්දෝරුවරයකුගේම කාර්ය විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද තොරතුරු හෝ වාර්තා සභාව විසින් හෝ එහි යම් සාමාජිකයකු විසින් හෝ සභාවේ යම් නිලධරයකු හෝ සේවකයකු විසින් හෝ අධිකරණයක් මගින් නියම කරනු ලැබ ඇතිවිට හෝ එහි බලතල ඉටුකිරීමේ කාර්ය සඳහා හැර හෝ යම් තැනැත්තකුට හෙළිකිරීම හෝ ප්‍රයෝජනයට ගැනීම නොකළ යුතු ය.

සභාව අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් විය යුතු බව.

**59.** සභාව අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

**60.** සභාවේ සියලුම සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු ය. සභාවේ සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව.

**61.** (1) රජයේ යම් නිශ්චල දේපළක් සභාවේ යම් කාර්යයක් සඳහා අවශ්‍ය වන අවස්ථාවක ඒ කාර්යය, ඒ දේපළ රජයේ ඉඩම් ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ විශේෂ ප්‍රදානයක් කළ හැකි හෝ බද්දක් දිය හැකි හෝ කාර්යයක් සේ සැලකිය යුතු අතර, ඒ අනුව සභාව වෙත ඒ දේපළ සම්බන්ධයෙන් කෙරෙන විශේෂ ප්‍රදානයකට හෝ බදු දීමකට හෝ ඒ ආඥා පනතේ විධිවිධාන අදාළ විය යුතු ය. රජයේ චංචල හා නිශ්චල දේපළ සභාවට ලබාදිය යුතු බව.

(2) රජයට අයත් යම් චංචල දේපළක් සභාවේ කාර්යය සඳහා අවශ්‍ය වූ අවස්ථාවක, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මඟින් මුදල් විෂයභාර අමාත්‍යවරයා විසින් එම චංචල දේපළෙහි සන්තකය හා පාලිච්චිය, සභාව වෙත පවරා සතුකර දෙනු ලැබිය හැකි ය :

එසේ වුවද, මේ උපවගන්තියේ මීට පූර්වයෙන් ඇති විධිවිධාන යටතේ, රජයට අයත් යම් චංචල දේපළක් කෙරෙහි බලපාන කිසි නියමයක්, ඒ දේපළ පිළිබඳ විෂයභාර අමාත්‍යවරයාගේ එකඟත්වය නොමැතිව, අමාත්‍යවරයා විසින් කරනු නොලැබිය යුතු ය.

**62.** (1) සභාවේ යම් නිශ්චිත කාර්යක් සඳහා යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම අවශ්‍ය වන්නා වූ ද, ඒ දේපළ ඒ කාර්යය සඳහා යෝජිත අත්කර ගැනීම ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මඟින් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන්නා වූ ද අවස්ථාවක, ඒ දේපළ පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය සේ සැලකිය යුතු අතර, ඒ අනුව එය ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කරගෙන, සභාව වෙත පවරනු ලැබිය හැකි ය. ඉඩම් අත්කර ගැනීම් පනත යටතේ නිශ්චල දේපළ අත්කර ගැනීම.

(2) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ සභාවට යම් නිශ්චල දේපළක් අත්කර ගැනීමට ගෙවිය යුතු වන යම් මුදලක්, සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ හෝ සභාවේ විධානය මත හෝ කරන ලද ක්‍රියා සඳහා ආරක්ෂාව.

**63.** (1) (අ) සභාව විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් සභාවට විරුද්ධව ; හෝ

(ආ) සභාවේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයකු හෝ කමිටුවක යම් නිලධරයකු විසින් මේ පනත යටතේ හෝ සභාවේ විධානය මත සද්භාවයෙන් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයකුට, නිලධරයකුට හෝ සේවකයකුට හෝ කමිටුවේ යම් නිලධරයකුට විරුද්ධව,

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ සභාවේ විධානය මත හෝ කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන්, ඔහුට විරුද්ධව යම් අධිකරණයක පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඔහු විසින් දරන ලද වියදම්, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරනු ලැබුවා යයි අධිකරණය තීරණය කරනු ලබන්නේ නම්, ඒ තැනැත්තාට සභාවේ අරමුදලින් එම මුදල ගෙවනු ලැබිය යුතු ය.

වැරදි.

**64.** (1) (අ) මේ කොටස යටතේ නියම කරනු ලැබ ඇති යම් වාර්තාවක් හෝ තොරතුරු සැපයීම පැහැර හරින ;

(ආ) තමන් විසින් සපයනු ලබන යම් වාර්තාවක හෝ තොරතුරක, දැන දැනම යම් අසත්‍ය ප්‍රකාශයක් කරන ;

(ඇ) ලියාපදිංචි මිනින්දෝරුවරයකු ලෙස ලියාපදිංචිය ලබාගැනීමේ කාර්ය සඳහා හෝ වෘත්තියේ යෙදීමේ වාර්ෂික බලපත්‍රය ලබා ගැනීම සඳහා –

(i) තමාගේ දැනුම අනුව යම් වැරදි කරුණක් සම්බන්ධයෙන් අසත්‍ය හෝ

නොමග යවන සුලු ප්‍රකාශයක් හෝ නියෝජනයක් වාචිකව හෝ ලිඛිතව කරන ; හෝ

(ii) එවැනි යම් අසත්‍ය ප්‍රකාශයක් හෝ නියෝජනයක් අන්තර්ගත බව තමා දන්නා යම් ලේඛනයක් සහාය වෙන ඉදිරිපත් කරන හෝ භාවිත කරන ;

(ඇ) තමා ලියාපදිංචි මිනින්දෝරුවරයකු නොවී -

(i) ව්‍යාජ ලෙස ලියාපදිංචි මිනින්දෝරුවරයකු බවට අඟවන ;

(ii) ලියාපදිංචි මිනින්දෝරුවරයකුගේ නාම හෝ පදවිය ලබාගන්නා හෝ පාවිච්චි කරන ;

(ඈ) තමා ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරයකු නොවී -

(i) ගාස්තු හෝ ප්‍රදාන සඳහා ඉඩම් මැනුම් වෘත්තියෙහි යෙදීම ;

(ii) තමා ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරයකු බවට අඟවන ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරයකුගේ පදවිය හෝ විස්තර ලබාගන්නා හෝ පාවිච්චි කරන ;

(iii) ඉඩම් මැනීම සිදුකිරීම සහතික කරන ;

(iv) ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරයකු විසින් සහතික කළයුතු බව මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ නියම කර ඇති යම් මැනුම් පිඹුරක්,

රූ සටහනක්, සිතියමක් හෝ වෙනත් ලේඛනයක් සහතික කරන හෝ අත්සන් තබන ; හෝ

(ඩ) සභාවේ සාමාජිකයකුව, නිලධරයකුව හෝ සේවකයකුව සිටිමින්, මේ කොටස යටතේ ස්වකීය කලතල ක්‍රියාවේ යෙදීමේ දී හෝ කර්තව්‍ය ඉටුකිරීමේ දී ඒ හා සම්බන්ධව තමන් විසින් ලබාගන්නා ලද යම් තොරතුරක්, ඒ තොරතුර හෙළිදරව් කිරීමට මේ කොටසින් බලය දී ඇති යම් කාර්යයක් නොවන යම් කාර්යයක් සඳහා වෙනත් තැනැත්තකු හට හෙළිදරව් කරනු ලබන ;

(ඪ) මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදනු ලබන යම් නියෝගයක් කඩ කරන,

සෑම තැනැත්තකුම මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

(2) මේ පනතේ වෙනත් යම් විධිවිධානයක් මගින් ප්‍රකාශිතව කිසිම දඬුවමක් සඳහා විධිවිධාන සලස්වා නොමැති, මේ පනත යටතේ වූ යම් වරදක් සිදුකරන සෑම තැනැත්තකුම මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී, රුපියල් දසදහසකට නොවැඩි දඩයකට හෝ මාස තුනක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් වන්නේ ය.

(3) මේ පනත යටතේ වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලැබූ විට-

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකුම හා නිලධරයකුම ;

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාර ආයතනයක් නම්, ඒ ව්‍යාපාර ආයතනයේ සෑම හවුල්කරුවකුම,

ඒ වරදට වරදකරුවකු ලෙස සලකනු ලැබිය යුතු ය :

එසේ වුව ද, ඒ වරද සිදුකරන ලද්දේ තමාගේ දැනුම නොමැතිව හෝ ඒ වරද සිදුකිරීම වැළැක්වීම සඳහා තමා තිබූ සියලු උද්යෝගයෙන් ක්‍රියාකළ බව, ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකු විසින් හෝ ව්‍යාපාර ආයතනයේ හවුල්කරුවකු විසින් ඔප්පු කරනු ලැබුවහොත්, ඔහු ඒ වරදට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.

**65.** (1) නියම කළයුතු යයි මේ කොටසින් නියමිත හෝ නියෝග සෑදීමට මේ කොටසින් බලය දී ඇති යම් කාරණයක් සම්බන්ධයෙන්, අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) (1) වන උපවගන්තිය යටතේ පවරනු ලැබ ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, අමාත්‍යවරයා විසින් පහත සඳහන් කරුණු සියල්ලම හෝ ඉන් යම් කරුණක් සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය :-

(i) මේ කොටස යටතේ නියම කරනු ලබන ඉල්ලීම් භාර ගැනීමේ ආකාරය සහ ක්‍රමය ;

(ii) මේ පනත යටතේ නියම කිරීමට නියමිත ආකෘතිපත්‍ර, ඉල්ලුම්පත්‍ර, සහතික සහ වෙනත් ලියවිලි ;

(iii) වෘත්තියෙහි යෙදීමේ වාර්ෂික බලපත්‍රයක් ලබා ගැනීමට කැමැත්ත දක්වන මිනින්දෝරුවරයකු විසින් හැදෑරීමට නියමිත අධ්‍යයන පාඨමාලා සහ පුහුණු පාඨමාලා ;

(iv) වෘත්තීයමය පරිචය සම්බන්ධයෙන් ලියාපදිංචි මිනින්දෝරුවරයන්ට දිය යුතු මාර්ගෝපදේශ.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර, ඒ නියෝග එසේ පළකරනු ලැබූ දින සිට හෝ එහි නිශ්චිතව සඳහන් පසු දිනයක සිට හෝ බලාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින සිට මාස හයක කාල සීමාවක් තුළ අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, එම අනනුමතියේ දින සිට, එහෙත් ඒ යටතේ ඊට කලින් කරන ලද කිසිවකට හානියක් නොමැතිව, පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් සාදනු ලබන යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

**66.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ පනතේ –

"ගුවන් ඡායාරූප ගතකිරීම" යන්නෙන්, පොළව මතුපිටට ඉහළින් සිට නිරාවරණය කරගන්නා ඡායාරූපීය හෝ දුරස්ථ සංවේදී ප්‍රතිබිම්බයක් අදහස් වේ.

"ගුවන් මැනුම්" යන්නෙන්, ගුවන් ඡායාරූප ශිල්පය මගින් මැනුම් ලබාගැනීමේ විද්‍යාව අදහස් වේ.

"කැඩැස්තර සිතියම" යන්නෙන්, කැඩැස්තර මැනුමකින් සපයනු ලැබෙන සිතියමක් අදහස් වේ.

"කැඩැස්තර මැනුම" යන්නෙන්, යම් ඉඩම් කොටසක් හෝ යම් පරිශ්‍රයක් ඇතොත් ඊට සම්බන්ධ යම් ගොඩනැඟිලි අයිතිවාසිකමකට හෝ සම්බන්ධතාවයක හිමිකම් තීරණය කිරීමේ හෝ අර්ථකථනය කිරීමේ කාර්ය සඳහා වන යම් මැනුමක් අදහස් වේ.

"දෙපාර්තමේන්තුව" යන්නෙන්, මිනින්දෝරු දෙපාර්තමේන්තුව අදහස් වේ.

"ඉඩම" යන්නට, ඉඩම තුළ හෝ එය මත ඇති අයිතීන් සහ සම්බන්ධතා ද ඇතුළත්ව යටපස, අභ්‍යවකාශය, ජලය සහ සමුද්‍රීය ප්‍රදේශ ද ඇතුළත් වේ.

"ඉඩම් මැනුම" යන්නෙන්–

(අ) පොළොවේ යම් කොටසක හෝ යම් ස්වාභාවික හෝ කෘත්‍රිම ලක්ෂණයක හෝ ආකාරය, සංස්ථිතිය, ස්ථානය, ප්‍රමාණය, ස්වරූපය, උස, ගැඹුර හෝ ස්වභාවය සහ පොළොවේ, පොළොවට ඉහළින් හෝ ඊට පහළින් මායිම් ස්ථානයන්හි, ස්ථානය, දිග සහ දිශාව දැන ගැනීමේ කාර්ය සඳහා නිශ්චය කිරීම හෝ පිහිටුවීම අදහස් වේ ;

(ආ) ඉඩමේ හෝ අභ්‍යවකාශයේ යම් අයිතිය හෝ සම්බන්ධතාවයේ ප්‍රමාණය නිශ්චය කිරීම හෝ ස්ථාපිත කිරීම ;

(ඇ) යම් ලක්ෂණයක පිහිටීම සහතික කිරීම සඳහා එම ලක්ෂණයේ පිහිටීම මායිමකට සාපේක්ෂව නිශ්චය කිරීම ; සහ

(i) කැඩැස්තර මැනුම ;

(ii) යම් නිරවද්‍යතාවයක ජාලයක් සකස් කිරීම ;

(iii) යම් පිඹුරක් හෝ සිතියමක් සකස් කිරීම ; සහ

(iv) (අ), (ආ) සහ (ඇ) යන ඡේදවල නිශ්චිතව දක්වා ඇති කර්තව්‍යයන්හි කාර්ය සඳහා ඡායාරේඛණමිතික ක්‍රම පාලක පිහිටුවීම ද,

ඇතුළත් වේ.

"සිතියම" යන්නෙන්, පොළොවේ කොටසක හෝ සමස්ත පොළොවට අදාළ (ස්වාභාවික හෝ කෘත්‍රිම ද්‍රව්‍ය නැතහොත් ඒ දෙයාකාර ද්‍රව්‍ය) භූමි ලක්ෂණවල හෝ වෙනත් තොරතුරුවල ප්‍රස්ථාරික, ඡායාරූපිත හෝ සංඛ්‍යාංකිත ආකෘතියකින් හෝ ඒ ආකෘතිවල එකතුවකින් ප්‍රත මැනුමකට වූ ඉදිරිපත් කිරීමක් හෝ ප්‍රක්ෂේපණයක් අදහස් වේ.

"පිඹුර" යන්නෙන්, යම් මැනුමක ප්‍රස්ථාරික නිරූපණයක් අදහස් වේ.

"ලියාපදිංචි මිනින්දෝරුවරයකු" යන්නෙන්, මේ පනත යටතේ සභාව විසින් ලියාපදිංචි කරන ලද මිනින්දෝරුවරයකු අදහස් වේ.

"ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරයා" යන්නෙන්, වෘත්තියෙහි යෙදීමේ වාර්ෂික බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති ලියාපදිංචි මිනින්දෝරුවරයකු අදහස් වේ.

"හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත" යන්නෙන්, 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත අදහස් වේ.

"ලේකම්" යන්නෙන්, සභාවේ ලේකම් ලෙස පත්කරගනු ලැබූ තැනැත්තා අදහස් වේ.

"සර්වේයර් ජනරාල්වරයා" යන්නෙන්, මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වන ලියාපදිංචි මිනින්දෝරුවරයකු අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

**67.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

උපලේඛනය (39 වන වගන්තිය)

බලපත්‍රලාභී ලියාපදිංචිය සඳහා තිබිය යුතු සුදුසුකම්-

(අ) ශාස්ත්‍රීය සුදුසුකම් :

(i) විශ්වවිද්‍යාලයකින් හෝ රජය විසින් පිළිගත් උසස් ආයතනයකින් ලබාගත් මැනුම් විද්‍යාව පිළිබඳ, සාමාන්‍ය උපාධි ඩිප්ලෝමාව හෝ මැනුම් විද්‍යාව පිළිබඳ ඊට උසස් සුදුසුකමක් ; හෝ

(ii) විශ්වවිද්‍යාලයකින් හෝ රජය විසින් පිළිගත් වෙනත් ආයතනයකින් පිරිනමනු ලබන මැනුම් විද්‍යාව පිළිබඳ උපාධිය ; හෝ

(iii) දියතලාවේ මැනුම් හා සිතියම් ගැනීමේ ආයතනයෙන් පිරිනමනු ලැබූ මැනුම් තාක්ෂණික ඩිප්ලෝමාව (උසස් පෙළ) ; සහ

(ආ) ප්‍රායෝගික පළපුරුද්ද :

(i) (අ) (i) වර්ගය සඳහා-

සභාව සැකසීමට අනුමත පරිදි අවම වශයෙන් අවුරුදු දෙකක ප්‍රායෝගික පළපුරුද්ද ;

(ii) (අ) (ii) වර්ගය සඳහා-

සභාව සැකසීමට අනුමත පරිදි අවම වශයෙන් අවුරුදු 3 ක ප්‍රායෝගික පළපුරුද්ද ;

(iii) ඉහත සඳහන් (අ) (iii) වර්ගය සඳහා-

සභාව සැකසීමට අනුමත පරිදි අවම වශයෙන් අවුරුදු දෙකක ප්‍රායෝගික පළපුරුද්ද සහ මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන තාක්ෂණික පරීක්ෂණයක් සමත් වීම ; හෝ

සභාව සැකසීමට අනුමත පරිදි අවම වශයෙන් අවුරුදු පහක ප්‍රායෝගික පළපුරුද්ද සහ එම කාලය තුළ ලියාපදිංචි වීමට එම කැපැත්තට ප්‍රමාණවත් වශයෙන් ප්‍රවීණත්වයක් ඇති බවට සභාවේ සෑහීමට පත්වන පරිදි කරනු ලබන පරීක්ෂණයක්.